# වාර්ෂික වාර්තාව 2014

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ஆண்டறிக்கை 2014

முகாமைத்துவ பட்டப்பின்படிப்பு நிறுவகம்

ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம்

# Annual Report 2014

POSTGRADUATE INSTITUTE OF MANAGEMENT

University of Sri Jayewardenepura

# වාර්ෂික වාර්තාව

# 2014

කළමනාකරණ පශ්චාත්උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

# පටුන


1. හැඳින්වීම
2. PIM දැක්ම, මෙහෙවර හා වටිනාකම්
3. අධ්‍යක්ෂකවරයා ගේ සමාලෝචනය
4. අත්පත් කරගත් ප්‍රතිඵල : පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු
5. පර්යේෂණ හා ප්‍රකාශන
6. කළමනාකරණ පුහුණුව හා උපදේශනය
7. ආධ්‍යාපනික හා භෞතික පරිසරය වැඩි දියුණු කිරීම
8. මානව සම්පත් සංවර්ධනය
9. පරිපාලන හා මූල්‍ය ක්‍රියාකාරිත්ව කාර්යක්ෂමතාව
10. කළමනාකරණ මණ්ඩලය
11. මතු සැලැසුම්
12. විගණන වාර්තාව හා පිළිතුරු

## 1. හැඳින්වීම

කළමනාකරණ පශ්චාත්උපාධි ආයතනය (පී.අයි.එම්) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයට අනුබද්ධ ව පිහිටවනු ලැබූ අර්ධ - ස්වාධීන ආයතනයකි. මෙහි අරමුණ වනුයේ විවිධ කළමනාකරණ හා පරිපාලන විෂය ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි උපදේශන, පුහුණු හා පර්යේෂණ ඔස්සේ ශ්‍රී ලංකාවෙහි කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය හා වෘත්තිකත්වය ප්‍රවර්ධනය කිරීම යි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ දහස් සංඛ්‍යාත කළමනාකරුවනට හා පරිපාලකයනට, අධ්‍යාපන හා නිපුනතා වර්ධනය සඳහා, අභියෝගාත්මක අවස්ථා සපයමින්, මෙ ම ආයතනය වඩා පුළුල් පදනමක් මත, වෘත්තීය කළමනාකරණ අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ වර්තමාන ජාතික අවශ්‍යතා සපුරාලයි. ශ්‍රී ලංකාවෙහි උසස් කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ පුරෝගාමියා ලෙසින්, කළමනාකරණ ඥානය, මෙන් ම නව්‍යකරණයෙහි හා ව්‍යාප්තියෙහි නියැලුණවුන්හට, මෙන් ම උසස් දැනුම් විකල්ප ගවේෂණය කරන්නන්හට, නායකත්වය සපයයි.

1978 විශ්වවිද්‍යාල පනත යටතේ අතුරු විධානයෙකින් පිහිටුවනු ලැබූ PIM ආයතනය, ශ්‍රී ලංකාවෙහි විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්නා පශ්චාත් උපාධි ආයතන හතට ඇතුළත් වන්නකි. සාපේක්ෂ වශයෙන් එ තරම් කල් පසු කළ ආයතනයක් නොවුව ද, PIM උක්ත ආයතන අතුරින් වැඩි ම ශිෂ්‍ය-සංඛ්‍යාවක් ඇති ආයතනය වන අතර, මෙ රට විශ්වවිද්‍යාල පද්ධතියෙහි එක ම ස්වයං-මූල්‍ය උත්පාදන උසස් අධ්‍යාපන ආයතනය වන්නේ ය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයෙහි කළමනාකරණ අධ්‍යයන පීඨයෙහි, 1981 දී පශ්චාත් උපාධි ආයතන ඒකකය පිහිටුවීම දක්වා මෙ ම ආයතනයෙහි ආරම්භය ඇදී යයි. CIDA පදනම යටතේ කැනේඩියානු විශ්වවිද්‍යාල දෙකක් වන ඔටාවා විශ්වවිද්‍යාලයයේත්, කාල්ටන් විශ්වවිද්‍යාලයයේත් සහයෝගිත්වයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු මෙ ම ඒකකයෙන් ආරම්භ කරන ලදි.. මෙ ම ඒකකය, 1986 දී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය තුළ, ස්වාධීන ආයතනයක් ලෙසින් උසස් කරන ලදි. 1995 දී මෙ ම ආයතනය කොළඹ 08, හි වූ ලෙස්ලි රණගල මාවතේ පිහිටි අළුතින් ඉදි කරන ලද ගොඩනැගිල්ලට ගෙන යන ලදි.

## 2. PIM හි දැක්ම, මෙහෙවර හා වටිනාකම්

### දැක්ම

දකුණු ආසියාවේ කළමනාකරණ විශිෂ්ටත්ව කේන්ද්‍රයක් බවට පත්වීම

### මෙහෙවර

අපි මානව සිතුවිලි දල්වාලමින්, ලොව දිනන්නට පිය නඟනා, දෙසට හිතැති නියමුවන් බිහි කරමු.

මෙම ප්‍රයත්නයේදී, අපි නව්‍ය ඉගැන්වීම් විධි, තියුණු පිරියෙසුම්, සරු-සබඳතා, දිරිමත් දිගු පැවැත්ම, හා ආදර්ශවත් පාලනය කෙරෙහි අනුගත වෙමු.

### අපේ වටිනාකම්

#### ඇල්ම

වෘත්තීමය පැවැත්ම පෙරදැරිකොට ගත් උද්‍යෝගය හා උත්සුක භාවය.

මූලික ක්‍රියාකාරකම් දර්ශකය (මුක්‍රිද)

- රැකියාව හා බැඳුණු කාර්ය භාරය පිළිබඳ පැහැදිලි බව
- කාර්ය සාධනයෙහි-ලා දක්වන උද්‍යෝගය
- නව විසැඳුම් සොයා ගැනීමෙහි-ලා නව්‍ය ලෙස සිතීම
- ආයතනික සාර්ථකත්වය වෙනුවෙන් විය යුතු දායකත්වය පිළිබඳ දැනුම්වත් බව
- අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් වැඩිමනත් පරිශ්‍රමයක් දැරීමට දක්වන කැමැත්ත

#### අවංක බව

ආයතනයේ යහපත සිතෙහි තබා ගෙන සද්භාවයෙන් කටයුතු කිරීම

මූලික ක්‍රියාකාරකම් දර්ශක (මුක්‍රිද)

- සිය කටයුතු අවංක ව මෙහෙයැවීම
- රහස්‍ය කටයුතු ඉටුකිරීමෙ දී විශ්වාසය තැබිය හැකි වීම
- සිය චර්යාව මුළුමනින් ම ආයතනයේ නීති-රීතිවලට අනුකූල ව හැසිරවීම
- අසාධු කටයුතු වෙනුවෙන් පොළොඹවා ගැනීමට නොහැකි බව
- පෞද්ගලික ප්‍රයෝජන අභිභවමින් ආයතනික අවශ්‍යතා ඉදිරියෙන් තබා ගැනීම

**අවදි බව**

අවබෝධයෙන් යුතු ව කටයුතු කිරීමේ දී අරමුණු හා ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය රැඳවීම

<u>මූලික ක්‍රියාකාරකම් දර්ශක (මුක්‍රිද)</u>

- අදාළ තොරතුරු කෙරෙහි දක්වන සිහිමත් බව
- අවශ්‍ය කවර මොහොතක හෝ ගත යුතු ක්‍රියාමාර්ග කෙරෙහි අවබෝධයෙන් සිටීම
- විවෘත මනසකින් යුතු ව උද්ගත වන අවශ්‍යතා කෙරෙහි අපක්ෂපාත ව බැලීම
- සිදු කෙරෙමින් පවතින ක්‍රියාකාරකම් කෙරෙහි පූර්ණ අවධානය රැඳවීම
- වේලාව හසුරුවාගැනීමේ දී දක්වන කාර්යක්ෂම භාවය




PIM හි ඉදිරි පස්-අවුරුදු කාලය වන ඉලක්ක 5 පහතින් දැක්වේ

පළමු වන ඉලක්කය :

අධ්‍යයන පාඨමාලාවල ගුණාත්මක භාවයත් ගැලපීමත්, විෂය පථයත් වැඩි දියුණු කිරීම.

දෙවන ඉලක්කය :

පර්යේෂණවල හා ප්‍රකාශනවල විශිෂ්ටත්වය වෙනුවෙන් කටයුතු කිරීම.

තෙවන ඉලක්කය :

කර්මාන්ත, විශ්වවිද්‍යාල හා වෘත්තීය සමාජ හා සමඟ සම්බන්ධතා වර්ධනය කිරීම.

සිව්වන ඉලක්කය:

අධ්‍යයන කටයුතුවලට, පර්යේෂණවලට හා උපදේශනවලට බෙහෙවින් උපකාර වන භෞතික සම්පත් වර්ධනය කිරීම

පස්වන ඉලක්කය :

එක සිට හතර දක්වා වූ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකිවන සේ පරිපාලන හා මූල්‍ය කාර්වයක්‍ෂමතාව වැඩි දියුනු කිරීම

# PIM හි තත්ත්ව පිළිවෙත

පර්යේෂණය, සමාලෝචනය හා අඛණ්ඩ වැඩි දියුණුව හා සම්බන්ධිත ක්‍රියාවලියක් ඔස්සේ, ශික්‍ෂණය, පර්යේෂණය, උපදේශනය, අඛණ්ඩ අධ්‍යාපනය හා අදාළ සියලු ම මධ්‍ය හා පරිවාර ක්‍රියාවල දී සියලු කල්හි ම විශිෂ්ටත්වයේ විශ්වීය සම්මත අනුගමනය කිරීමට අපි බැඳී සිටිමු. පුහුණුවත් සෙසු පහසුකමුත් සපයමින් නිපුණ හා පාරිභෝගික නැඹුරුවෙන් යුතු කාර්ය මණ්ඩලයක් ද, ආචාර්ය මණ්ඩලයක් ද ප්‍රවර්ධනය කිරීමට අපි කැපවී සිටිමු. අප ගේ ආයතනික ක්‍රියාවලි අඛණ්ඩ ව දියුණු කරමින්, සමස්ත විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා අපි ISO 9001-2008 ආකෘතිය උපයෝගී කොට ගනිමු.

PIM තත්ත්ව කළමනාකරණ ක්‍රම පද්ධතිය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් සහතික කොට ඇත. අධ්‍යයන, පරිපාලන හා මූල්‍ය අංශවල මෙන් ම, පුස්තකාල හා පරිඝණක කේන්ද්‍රය යන, PIM හි කළමනාකරණ පද්ධතියෙහි ඇතුළත් ප්‍රධාන ඒකක වලට යොදාගත් අභ්‍යන්තර ක්‍රම පද්ධති වෘත්තීය ආයතනයක පැවතිය යුතු ක්‍රමවේද හා නිශ්චිත සම්මත එ ම ක්‍රම පද්ධතිය ට අනුගත වන බවට තහවුරු වේ. තව ද, ආයතනයේ ක්‍රම පද්ධතියට යොදා ගත් සම්මත එක එල්ලේ තත්ත්වය කෙරෙහි බලපායි. එ මෙන්ම අඛණ්ඩ වැඩි දියුණුවත්, පාරිභෝගික තෘප්තියත් ඉන් තව දුරටත් තහවුරු වේ. මෙර ට විශ්ව විද්‍යාල පද්ධතියෙහි ISO 9001: 2008 සහතිකය ලබා ගත් එක ම ආයතනය කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය වේ.

## 3. අධ්‍යක්ෂකවරයා ගේ සමාලෝචනය

ආරම්භක අධ්‍යක්ෂකවරයා ගේ ප්‍රධානත්වයෙන්, පශ්චාත්උපාධි අධ්‍යයන ඒකකයේ හඳුන්වා දුන් විශේෂ වැඩ සටහන් ඔස්සේ දැනට තිස් වසරක ට පෙර, PIM ආයතනය ශ්‍රී ලංකාවට පිරිමස්නා කළමනාකරුවන් ප්‍රවර්ධනය කිරීමේ ජාතික මෙහෙවරට ප්‍රවිෂ්ට වූ අවස්ථාවේ දී ඉහළ මට්ටමෙක කළමනාකරණ අධ්‍යයනය සඳහා මෙරටෙහි එතරම් සැලැකිල්ලක් නොවී ය. එ හෙයින්, ශ්‍රී ලංකාවෙහි MBA උපාධි වැඩ සටහන් පිහිටුවාලීම සඳහා ආරම්භක අධ්‍යක්ෂකවරයා, කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සියේ (CIDA) සහයෝගය ලබා ගැනීමේ අටියෙන් එම ඒජන්සිය සමඟ සාකච්ඡා පැවැත්වී ය. 1980 දශකයේ මුල් අවදියේ දී, මෙ රටෙහි ඒකාධිකාරී වෙළෙඳ පොළක් බිහි විය. ඉන් තිස් වසරකට පසු එ නම්, දැන් එ ම වෙළෙඳ පොළ බෙහෙවින් වෙනස් වී ඇති අතර තරගකාරී සවභාවයක් ද උසුලයි.

රටෙහි විශ්ව විද්‍යාල අටෙක MBA උපාධිය හා එ හා සමාන පශ්චාත් උපාධි පිරිනමයි. දොළහකට අධික පෞද්ගලික-විදේශීය MBA වැඩ සටහන් PIM හා සමඟ තරග කරයි. මෙ ම වැඩ සටහන්, විදේශ අරමුදල් යොදා ගනිමින් ප්‍රබල ව ප්‍රචාරණය කරන අතර MBA වැඩ සටහන් සඳහා PIM අය කරන ප්‍රමාණය මෙන් දෙගුණයකට ද වඩා ගාස්තු අය කරයි.

මෙ ම තරගකාරීත්වය ඇති වනුයේ ප්‍රවේශ සුදුසුකම් පහත හෙළීමෙන් මෙන් ම, ආභ්‍යන්තරික විශ්ව විද්‍යාලයවල ඇති ප්‍රසිද්ධියට පත් සම්පත් දායකයන් යොදවා ගැනීමෙනි. ස්ව-උත්පාදන ආදායමෙන් සිය කටයුතු මෙහෙයැවීමේ අභිලාෂයෙන් මෙහෙයවන ලද PIM ආයතනයට මේවා ප්‍රබල අභියෝග වේ. PIM ආයතනය මුහුණ දෙන මෙ ම සීමාවන් තරගකාරී, පෞද්ගලික ආධ්‍යාපනික ආයතනවලට කවර ලෙසකින් හෝ අවහිරතා ඇති නොකරයි. ස්ව-උත්පාදන ආදායමෙන් ම සිය සියලු කටයුතු මෙහෙයවා ගැනීමේ ස්වයං-වාරණ ක්‍රියා මාර්ගය නිසා වේතන, උපයෝගීතා, සම්පාදන, ප්‍රවාහන අවශ්‍යතා, මූල-ධන වියදම් වසර තුළ දී, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ආයතනය 2009-2012 ඒකාබද්ධ සැලැසුම මත උපදේශකත්වය සපයමින් මනාව මෙහෙයවන ලද්දේ කළමනාකරණ අධ්‍යක්ෂක මණ්ඩලයත් ආධ්‍යාපනික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලයත් විසිනි. ප්‍රබල ප්‍රතිඵල ඇතිකරවන ක්ෂේත්‍ර වන (i) පශ්චාත් උපාධි මට්ටමේ අධ්‍යාපනය (ii) පර්යේෂණ හා ප්‍රකාශන (iii) පුහුණු හා උපදේශන සේවා (iv) ආධ්‍යාපනික පරිසරය නඟාසිටුවීම හා (v) පරිපාලන හා මූල්‍ය කාර්යක්ෂමතාව පිළිබඳ පොදු ක්‍රියාකාරීත්වය දිරිගන්වනසුලු බව පවසනුයේ සතුටිනි. මින් පසු ඉදිරිපත් කෙරෙනුයේ මානවසම්පත් සංවර්ධනය හා පරිපාලන-මූල්‍ය කාර්යක්ෂමතා පිළිබඳ අංශ යි.

විමර්ශනයට බඳුන් කළ හැකි වුව ද ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයාතනවල අනාගතය රැඳී පවතිනුයේ ස්වීයත්වයත් පාලනයත් අතර මනා තුලනයක් පවත්වා ගැනීමෙනි. එක් අතෙකින්, රටට අවශ්‍ය වනුයේ රාජ්‍ය ව්‍යවහයව ලා සම-මූල්‍ය උත්පාදන සම-කළමනාකරන හා සම-පාලන සම්ප්‍රදායක් වන අතර, අනිත් අතින් බලන විට අවම සම්මත විවිධ ව්‍යවසායනවල තහවුරු කිරීම යි.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) ස්වීයත්වය එහි නෛතික බලය පවරන ලද රෙගුලාසිවල ගැබ් කොට ඇති අතර ඉන් පරිපාලන මූල්‍ය හා මෙහෙයැවීම් පිළිබඳ ස්වාධීනත්වය සලකා ඇත. තව ද PIM ආයතනය, කවර හෝ අය-වැය ප්‍රතිපාදන සඳහා භාණ්ඩාගාරයේ සහාය නොපතන අතර, නව ගොඩනැඟිලි ඉදිකිරීම් වැනි ප්‍රාග් ධන වියදම් සඳහාවත් කිසිවක් අපේක්ෂා නොකෙරේ.

පසුගිය අවුරුදු කිහිපය තුළ දී ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල ශීඝ්‍ර වැඩි වීමක් සිදුවී ඇත. එහෙත්, සවයං-මූල්‍ය උත්පාදන ආයතන හා අඛණ්ඩ පදනමක් මත, භාණ්ඩාගාරය ප්‍රදානයන් සැලකිය යුතු ප්‍රමානයක් මත මෙහෙයැවෙන රජයේ විශ්වවිද්‍යාල වැනි ආයතන අතර පැහැදිලි වෙනසක් ඇති කළ යුතු ව පවතී. පාඨමාලා ද, සම්ප්‍රදායයෙන් පරිබාහිර දේශන පැවැත්වීම් ද, සාමූහික හා අන්‍යොන්‍ය සේ පැවැත්වෙන අධ්‍යයන සැසි, සාමාන්‍ය දේශනවලට අමතර ව සැපැයෙන ඉගැනුම් - සහායතයන් ද, පාරිභෝගික අවශ්‍යතා පදනම් කර ගෙන සැලැසුම් කරන ලද සාමාන ආයතන මහත් රාශිය අතුරින්, PIM ආයතනය ව්‍යුහාත්මකව වෙනස් වේ. PIM ආයතනයෙහි කේන්ද්‍රීය අපේක්ෂාව වනුයේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල නියැලුනවුන් වෘත්තිකයන් බවට පමුනුවා-ලීම යි. කාර්ය බහුල රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල නියුක්තිකයන් සඳහා සාමාන්‍ය කාර්ය වේලාවලින් බැහැර ව, අධ්‍යයන අවස්ථා පහසුකම් සපයන හෙයින් අප ගේ කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීම යුක්ති-යුක්ත වේ. විශිෂ්ටත්වය පිළිබඳ ව මහත් ප්‍රයත්නයෙකින් උපයා ගන්නා ලද කීර්තිය තව දුරටත් පවත්වා ගැනීම PIM ආයතනයට අවශ්‍ය වේ.

පෞද්ගලික ව්‍යවසාය සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යක්ශමතා දර්ශකය වනුයේ ලාභදායීත්වය යි. රාජ්‍ය ව්‍යවසාය සම්භන්ධයෙන් ලාභදායීත්වය ප්‍රමාණවත් දර්ශකයක් නොවන බව පෙනී යන අතර, ඉන් බොහෝමයක් ලාභය උපදවන කාර්යවල නොනියැලෙන හෙයින් එ ම ආයතන ලාභ උපරිමය අපේක්ෂාවෙන් බිහි වූ ඒවා නො වේ. එ සේ වතු ද භාණ්ඩාගාරවට බරක් නොවන ලෙසින් එ ම රාජ්‍ය ව්‍යවසාය ක්‍රියාත්මක වන්නේ නම්, අපගේ අදහස අනුව එ වැනි ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කළ යුතු ය. PIM ආයාතනයේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයත්, සේවා සැපැයීමත් වැඩි දියුණු කිරීම සඳහා අභිප්‍රේරණය සපයනුයේ කාර්යඵල පාදක කරගත් විගණනයෙකින් පමණි.

නම්‍යතාව රඳවාගනු සඳහා විවිධ වර්ගවල ව්‍යවසාය බිහිකිරීමත්, කළමනාකරණයත්, අධීක්ෂණයත් වග බලා ගැනීමත් සඳහා අපට යම් නිර්ණායකයක් අවශ්‍ය වේ. මේ අනුව ස්වයං-මූල්‍ය උත්පාදනයක් ද, වාර්තාකරණයක් ද, පිරිස් හා යහ පාලන සංවිධානයක් ද සහිත වඩා පුළුල් හා විවිධ ව්‍යවසාය පැවැතිය යුතු ය. මූල්‍ය ස්වාධීනත්වයත් මානව සම්පත් පාලනයත් නෙමැති වීම PIM ආයතනයේ දිගු-කාලීන සංවර්ධනයත්, වෙළෙඳපොළට අනුකූල ව හැඩගැසීමත්, කාර්යඵල වර්ධනයත් කෙරෙහි දැඩි අවහිරතා ඇති කරයි. PIM ආයතනයෙහි පූර්ණ වර්ධනය ළඟා කරගනු පිණිස PIM කළමනාකරණ මණ්ඩලය සතු ව යම් ප්‍රමාණයකට මූල්‍ය ස්වාධීනත්වයක් පවත්වාගැනීම ඉතා වැදගත් වේ.

## 4. අත්පත් කරගත් ප්‍රතිඵල

### පශ්චාත් උපාධි ආයතනය

### වර්ෂය තුළ පශ්චාත් උපාධි නිමැවීම

ලේඛනගත පරිදි ම, ආධ්‍යාපනික වැඩ සටහන් සාර්ථක ව ක්‍රියාත්මක කරන ලදි. මෙම වර්ෂය තුළ විද්‍යාපති උපාධියෙහි ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමාවෙහි ද අවශ්‍යතා සම්පූර්ණ කරන ලද විද්‍යාර්ථීන්ගේ සංඛ්‍යා අංක 1 වගුවෙහි දැක්වේ.

***අංක 1 වගුව : 2014 හි පශ්චාත් උපාධිය නිම කළ විද්‍යාර්ථීන්***

| **පාඨමාලාව** | **සංඛ්‍යාව** |
|---|---|
| ව්‍යාපාරික කළමනාකරණය පිළිබඳ දර්ශනපති උපාධිය | 01 |
| ව්‍යාපාරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 326 |
| මානවසම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 01 |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය | 91 |
| ජාත්‍යන්තර වෙළඳාම හා පහසුකම් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 22 |
| e-government පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 62 |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 03 |
| කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 04 |
| **මුළු උපාධිධරයන් සංඛ්‍යාව** | 510 |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

### වර්ෂය තුළ ශිෂ්‍ය-බඳවා ගැනීම

2013 වර්ෂය තුළ විද්‍යාපති හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා බඳවා ගත් ශිෂ්‍ය-සංඛ්‍යාව 2 වැනි වගුවෙන් දැක්වේ.

***අංක 2 වගුව : 2014 වර්ෂය තුළ ශිෂ්‍ය-බඳවා ගැනීම***

| **පාඨමාලාව** | **සංඛ්‍යාව** |
|---|---|
| ව්‍යාපාරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 257 |
| දර්ශනවේදී උපාධිය | 17 |
| **එකතුව** | **268** |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

**පාඨමාලා සැලැසුම් හා (සැපැයුම) නිකුතුව**

**(අ)** වර්ෂය තුළ මෙහෙයවන ලද MBA පාඨමාලාවල හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවල හා ගුණාත්මක භාවයත්, අදාළත්වයත් වැඩි දියුණු කිරීම සඳහා නව-ප්‍රයත්න යොදන ලදි. තරගකාරිත්වය අභිභවා රැඳී සිටීමේ අරමුණින්, ශිෂ්‍යයනට අධ්‍යයන කටයුතුවල දී වටිනාකමක් ලබා දෙන ගමන් ම, නැඟී එන ප්‍රවනතා මෙන් ම නව දැනුම්-ක්ෂේත්‍රවලට ගැළපෙන පරිදි, අධ්‍යයන-පාඨමාලා වැඩි දියුණු කෙරිණි. තවද, පහතින් දැක්වෙන වෙනස්කම් හඳුන්වා දෙමින්, ඒවා ප්‍රසිද්ධියට පත් කරන ලදි.

- **පාඨමාලා ආකෘති යළි-සැලැසුම් කිරීම**

අන්තර්ගතයෙහි තීව්‍රතාව ද, පැහැදිලි දිශාව ද සපයනු සඳහා පාඨමාලා ආකෘති යළි සකසන ලදි. පූර්ණ එ මෙන් ම, මනා ව සැලැසුම්කරන ලද පාඨමාලා ආකෘති හා සමඟ ම, අනිවාර්යයෙන් කියැවිය යුතු දෑ ලැයිස්තුගත කිරීමෙන් (I) පාඨමාලා සූදානම් කිරීමෙන් හා දැනුම නිකුතුවෙන් දේශකයනට ද, (II) යම් සැසියක් සඳහා ශිෂ්‍ය - කළමනාකරුවනට කල්වේලා ඇතිව සූදානම් වීමට ද, උපකාරී වී ඇත.

**(ආ)** **නිකුතු-මාධ්‍ය**

මෙහිලා පැහැදිලි වෙනස්කම් දෙකක් සිදුකරන ලදි. පැය තුනක සැසියක් තුළ දී එක් කොටසක දී පමණක් නියම ලෙසින් ම දේශනය සඳහා යොදවා ගත යුතු ව පවතී. එ නම් පැවසුම (Tell) ය. සැසියේ ඉතිරි කාලය දැක්වීමටත් (උදා : වීඩියෝ) ඇසීමට හෙවත් සංවාදයට (Ask) එ නම් සාකච්ඡාව හා සංවාදයටත්, කිරීමට (Do) හෙවත් අභ්‍යාස හා විශයානුබද්ධ අධ්‍යයන සඳහාත් යෙදැවිය යුතුව පවතී. ශිෂ්‍ය කළමනාකරුවණට ධනාත්මක බලපෑමක් ඇති කරවමින් අපේක්ෂිත ඉගෙන්වීම්වල ප්‍රතිඵල ලබා ගැනීමට නිකුතුව (Delivery) සඳහා මෙ ම මාධ්‍ය හතර ම උපයෝගී කොට ගැනීමේ අවශ්‍යතාව ආචාර්ය මණ්ඩලය අවබෝධ කොට ගෙන සිටිති.

**(ඇ)** **ආරාධිත දේශන**

විශේෂිත මාතෘකා මත ආගන්තුක දේශන පැවැත්වීමට කර්මාන්ත ක්ෂේත්‍රයෙහි නියුක්ත වූ ප්‍රමුඛ පුද්ගලයන් බෙහෙවින් අන්‍යුක්ත කර ගැනීම මහත් අවශ්‍යතාවක් ව පවතී. මෙ ම සැසි පූර්ව-සැලැසුම් කරන ලද ඒවා වන අතර පාඨමාලා ආකෘතිවලට ද ඇතුළත් කොට ඇත. මෙ ම ආගන්තුක දෙශකයන්ගේ ඉදිරිපත් වීම වැඩදායක වී ඇති අතර, ඇත්ත වශයෙන් ම මෙ ම ක්‍රියා මාර්ගය අපගේ MBA වැඩසටහන් හා අපගේ තරගකරුවන්ගේ වැඩසටහන් අතර වැදගත් වෙනස්කමක් නිර්මාණය කරයි.

### (ඈ) ලකුණු නිකුත් කිරීම

නියමිත වේලාවෙහි දී ලකුණු නිකුත් කිරීම සඳහා ආචාර්ය මණ්ඩලයට නිශ්චිත කල් වේලා ලබා දී ඇත. එ නම් අවසාන පරීක්‍ෂණය පවත්වන දිනයේ සිට දින 28ක් ඇතුළත දී ය. මේ පිළිබඳ ව සමීප අවධානයක් රඳවා ඇති අතර මෙ ම කරුණ ආචාර්ය මණ්ඩලයේ වැදගත් ඵලදායිතා දර්ශකයක් වෙයි.

### (ඉ) ශිෂ්‍ය- ඇගැයීම්

පාඨමාලාවක් පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ ආකල්පය නිරීක්‍ෂණය කිරීමට ශිෂ්‍ය-ඇගැයීම වදැගත් වෙයි. වාර අවසානයේ දී එක් එක් ශිෂ්‍යයා විසින් සිදු කෙරෙන ඇගැයීම සම්පිණ්ඩනය කෙරෙන අතර ශිෂ්‍ය කළමනාකරුවන්ගේ දෘෂ්ටිය අනුව ආචාර්ය මණ්ඩල - සාමාජිකයන්ගේ කාර්ය ඵල දක්වනු ලැබේ. ආචාර්ය මණ්ඩලයේ තවත් එක් වැදගත් ඵලදායිතා දර්ශකයක් ලෙසින් 1 සිට 5 දක්වා වූ මිනුම් දණ්ඩක පොදු ඇගැයීම් 4 දර්ශකයක් සෑම ආචාර්ය මණ්ඩල සාමාජිකයකු ගෙන් ම අපේක්‍ෂා කෙරේ.

### (ඊ) නේවාසික වැඩ-මුළු

වැඩ සටහන් නිකුතුවේ වැදැගත් අංශයක් නම්, නේවාසික වැඩ-මුළු පැවැත්වීම යි. මෙ ම වැඩ-මුළු සාමාන්‍යයෙන් පවත්වනු ලබන්නේ කොළඹින් බැහැරි ස්ථානවල ය. මෙ ම වසර තුළ දී, විද්‍යාපති හා පශ්චාත්-උපාධි ශිෂ්‍යයන් ගේ යහපත සඳහා මෙ වැනි වැඩ-මුළු දෙකක් පවත්වන ලදි. නිර්මාණශීලිත්වයත්, ශිෂ්‍යයන් අතර සුහදතාවත් වර්ධනය කිරීමට දිරි ගන්වන නිසල පරිසරයක, තෝරා ගැනුණු විෂය පදනම් කරගෙන සාකච්ඡා කිරීමට මෙම වැඩ-මුළු උපකාරී විය.

## 6. පර්යේෂණ හා ප්‍රකාශන

ශ්‍රී ලංකාවෙහි කළමනාකරණ විෂයයෙහි පර්යේෂණ මෙතෙක් පවතිනුයේ කුළුදුල් අවදියෙහි ය. මෙ හි-ලා පවත්නා අභියෝගය නම් අපගේ පර්යේෂණ ප්‍රයත්න අනුගමනය කළ යුතු දිශාන්තය පිළිබඳ ව සුදුසු ආකෘතියක් තනා ගැනීම යි. අපට පෙනී යන පරිදි පර්යේෂණයක ප්‍රමුඛ අරමුණ විය යුත්තේ වෘත්තියක් ලෙසින් කළමනාකරණය පෝෂණය කිරීමට අවශ්‍ය වන දේශීය හර පද්ධතියක් සොයා ගැනීමයි. මෙ ම අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා පර්යේෂණ පිළිගත් මට්ටම් වෙත ඔසොවා-ලීමට අවශ්‍ය වන ක්‍රම-වේද හා තර්කානුකූල ප්‍රවේශ සොයමින් සිටිමු.

2013 වර්ෂය තුළ දී, ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘති 192 ක් නිම කොට ඇති අතර, ඒවා සන බැම්මෙන් බැඳ පුස්තකාලයෙන් ලබා ගැනීමට සලස්වා ඇත.

**ප්‍රකාශන**

විමර්ෂණයට ලක් කැරුණු කාලය තුළ දී ප්‍රකාශන ක්ෂේත්‍රයෙහි සතුටුදායක ප්‍රගතියක් දැක්විණි.

### (i) PIM Presentation Guideline

PIM ආචාර්ය මණ්ඩලයේ ද, ශිෂ්‍යයන්ගේ ද නිබන්ධන ලිවීම හා ඉදිරිපත් කිරීම සම-පදනමකට ගෙන ඒමට උපකාරී වන පරිදි, PIM Presentation Guidelines නමින් යුත් අත්-පොතක් සැලැසුම් කොට ප්‍රකාශනයට පත් කරවන ලදි. අනුකූලතාව දැක්විය යුතු සම්මතයට පත් නීති-රීති හා මඟ-පෙන්වීම් මීට ඇතුළත් වන අතර මෙහි අන්තර්ගතය බෙහෙවින් ම පදනම් ව ඇත්තේ Manual of American Psychological Association නැමැති සංග්‍රහයෙහි ඉදිරිපත් කරන ලද නිර්ණායක වෙයි. මෙ ම ප්‍රකාශනය සැකැසීමෙහිලා ආචාර්ය මණ්ඩලය ද දායක වූහ.

### (ii) Sri Lankan Journal of Management (SLJM)

1996හි දී අරඹන ලද මෙ ම ත්‍රෛමාසිකය ප්‍රකාශනයත්, සංවාදයත් සඳහා දිගින්-දිගට ම පදනමක් සලසා දෙයි. 2013 වසර තුළ දී අධි-ප්‍රමාණයේ වෙළුම් දෙකක් ප්‍රකාශයට පත් කරන ලදි. SLJM ප්‍රකාශනයෙහි මූලික අරමුණ නම්, කළමනාකරණය හා සම්බන්ධිත ගැටළු ආමන්ත්‍රණය කිරීමත්, අධ්‍යයන කාර්යමණ්ඩලයේ හා ශිෂ්‍යයන්ගේ අති-විශිෂ්ට පර්යේෂණවල, ප්‍රතිඵල ව්‍යාප්ත කිරීමත් සඳහා සුදුසු ප්‍රකාශන මාධ්‍යයක් සපයා දීම යි. ව්‍යාපාරික ක්ෂේත්‍රයෙහි නියැළුණු අය හට ද මෙ ම ප්‍රකාශනයට සිය නිබන්ධන ඉදිරිපත් කිරීමට ඇරියුම් කෙරේ.

### (iii) The Professional Manager

SLJM ප්‍රකාශනයට අමතර ව මෙ ම අර්ධ-වාර්ෂික සඟරාව අරඹන ලද්දේ වත්මන් කළමනාකරුවන් ගේ නැඟී එන අවශ්‍යතා සපුරාලීමට යි. විශේෂිත අරමුණක් පදනම් කර නොගෙන පහසුවෙන් අවබෝධ කර ගත හැකි ශෛලියකින් කළමනාකරණය හා සම්බන්ධව අවශ්‍යයෙන් ම දත යුතු කරුණු මෙ ම සඟරාවෙන් ප්‍රකාශයට පත් කෙරේ.

**(iv)** විමර්ශනයට භාජනය කෙරෙන මෙ ම වර්ෂය තුළ දී ආචාර්ය මණ්ඩලය මෙන් ම ශිෂ්‍යයන් විසින් රචිත ලිපි 36 ක් පුවත්පත්වල පළ කැරිණි.

***අංක 3 වගුව : පර්යේෂණ, නව්‍යකරණය හා ප්‍රකාශන***

| | ප්‍රකාශනයට පත් කරන ලද | විකිණීමට තබන ලද | ඉදිරිපත් කරන ලද සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) MBA ශිෂ්‍යයන්ගේ පර්යේෂණ | -- | -- | 192 |
| (ආ) සංග්‍රහ | 02 | 02 | |
| (ඇ) සඟරා | 02 | 02 | |
| (ඈ) ග්‍රන්ථ | 02 | 02 | |
| (ඉ) පුවත්පත්හි ප්‍රකාශිත ලිපි | 42 | දෛනික පුවත්පත්හි ප්‍රකාශිත | |
| **එකතුව** | **48** | **06** | **192** |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

## <u>PIM පර්යේෂණ දිනය</u>

PIM ආයතනයේ ප්‍රථම වාර්ෂික පර්යේෂණ දිනය 2014, නොවැම්බර් මස 28 දින පැවැත්වුණු අතර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති, ශාණිකා හිරිඹුරේගම මහත්මාව එ හි ප්‍රධාන ආරාධිතයා ලෙසින් සහභාගි වූවා ය.

ශිෂ්‍යයන්, විද්‍යාර්ථීන්, පර්යේෂකයන්, මහජන සම්බන්ධතා ක්‍රියාකරීන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් ඇතුළු විශාල ශ්‍රාවක පිරිසකට වැඩ දායක වන අයුරින්, අපගේ පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහා මෙ ම සංකල්පය PIM ආයතනය විසින් අරඹන ලදි. ඇත්ත වශයෙන් ම, දකුණු ආසියාවේ කළමනාකරණ විශිෂ්ටත්වයේ කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා අපගේ විශිෂ්ටත්ව ආකෘතියෙහි එක් ආරම්භයකි. ඔස්ට්‍රේලියාවේ නිවු සවුත් වේල්ස් (UXISW) විශ්වි විද්‍යාලයත් සමඟ අරඹන ලද පර්යේෂණ සහයෝගිතා සම්බන්ධතාව හා සමඟ ම, අපගේ පර්යේෂණ කාර්ය භාරය වඩා තීව්‍ර කිරීමට අපි අපේක්ෂා කරමු.

## 7. කළමනාකරණ පුහුණුව හා උපදේශන සේවා

ව්‍යාපාරික ප්‍රජාව හා සමඟ ක්‍රියාකාරී කොටස්කරුවකු වෙමින් ආයතනවල කාර්ය මණ්ඩලය සඳහා පාරිභෝගික-කේන්ද්‍රීය පුහුණු-සේවා පැවැත්වීම, කළමනාකරන පශ්චාත් උපාධි ආයතනය මහත් අභිමානයෙන් සලකයි. රාජ්‍ය හා පෞද්ගලික දෙපාර්ශවයට ම අයත් බැංකු, මූල්‍ය කටයුතු හා රක්‍ෂණය වැනි සේවා මෙන් ම නිෂ්පාදනයට සම්බන්ධිත ආයතන ද මෙ ම පාරිභෝගිකයනට අයත් විය. අංක 4 වගුවෙහි දැක්වෙන පරිදි මෙ ම වසර තුළ දී ආයතන නවයක් (09) සඳහා කෙටි හා මධ්‍ය-කාලීන පුහුණු වැඩ සටහන් පැවැත්විණි.

*අංක 4 වගුව : 2014 පවත්වන ලද කළමනාකරණ ප්‍රවර්ධන වැඩසටහන්*

| | | | |
|---|---|---|---|
| 01 | HOLCIM Lanka Ltd සීමාසහිත හොල්සිම් (ලංකා) | Management Development Training Programme for Middle Management of the Company | මධ්‍ය කළමනාකරුවන් සඳහා කළමනාකරණ ප්‍රවර්ධන වැඩ සටහන |
| 02 | Ministry of Health සෞඛ්‍ය අමාත්‍යංශය | Management Development Training Programme for Middle Officers | වෛද්‍ය නිලධරයන් සඳහා කළමනාකරණ ප්‍රවර්ධන පාඨමාලාව |
| 03 | Peoples Leasing & Finance PLC පීපල්ස් ලීසිං සමාගම | Management Development Training Programme for Higher Grade Branch Managers | ඉහළ ශ්‍රේණියේ ශාඛා කළමනාකරුවන් සඳහා කළමනාකරණ ප්‍රවර්ධන වැඩ සටහන |
| 04 | Sri Lankan Airlines ශ්‍රී ලංකන් ගුවන් සේවාව | Leadership Development Programme for Senior Managers | ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා නායකත්ව පුහුණු වැඩ සටහන |
| 05 | National Savings Bank ජාතික ඉතිරිකිරීමේ බැංකුව | Management Development Training Programme for AGMs | සහකාර සාමාන්‍යාධිකාරීවරුන් සඳහා කළමනාකරණ ප්‍රවර්ධන වැඩ සටහන |
| 06 | John Keells Holdings PLC ජෝන් කීල්ස් හෝල්ඩිංස් | Management Development Training Programme for Senior Management | ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා කළමනාකරණ ප්‍රවර්ධන වැඩ සටහන |
| 07 | Central Finance PLC සෙන්ට්‍රල් ෆිනෑන්ස් | Management Development Training Programme for Branch Managers | ශාඛා නිලධරයන් සඳහා කළමනාකරණ ප්‍රවර්ධන වැඩ සටහන |
| 08 | Amazon Trading (Pvt) Ltd සීමාසහිත ඇමසන් ට්‍රේඩින් | Course in Business English & Professional Communication | ව්‍යාපාර සඳහා ඉංග්‍රීසි හා සන්දේශනය පිළිබඳ පාඨමාලාව |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

ප්‍රායෝගික කළමනාකරණ ගැටලුවලට මුහුණ දීමෙන් ආචාර්ය මණ්ඩලයේ විෂය පථය හා නිපුණතා වර්ධනය කර ගැනීමට ඉවහල් වන්නේ යැ යි පෙනී යන කළමනාකරණ උපදේශන වැඩ සටහන් ප්‍රතිපත්තියක් ලෙසින්ද, PIM ආයතනය භාර ගනී. ආයතනික සැලැසුම්කරණය, ආයතනික ප්‍රති-ව්‍යුහගත කිරීම්, කාර්ය මණ්ඩල කාර්ය-විග්‍රහ (job analysis) හා වේතන දීමනා පිළිවෙත්, පුහුණුව හා ප්‍රවර්ධනය, හා ආයතනික ප්‍රවර්ධනය පිළිබඳ ක්ෂෙත්‍රවලට අදාළ උපදේශන සේවා සැලැකිය යුතු සංඛ්‍යාවක් 2013 වසර තුළ දී, සාර්ථක ව නිම කරන ලදි.

## 8. ආධ්‍යාපනික හා භෞතික පරිසරය වැඩි දියුණු කිරීම

වර්ෂය තුළ අඛණ්ඩ ව සිදු කරන ලද පහතින් දැක්වෙන ආධ්‍යාපනික හා භෞතික පරිසරය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් අවධානය යොමු කරවීමේ අවශ්‍යතාව PIM ආයතනය හොඳින් අවබෝධ කර ගෙන සිටී.

### වාර්ෂික ආචාර්ය-මණ්ඩල වැඩ මුළුව

වාර්ෂික ආචාර්ය-මණ්ඩල වැඩ මුළුව පවත්වන ලද්දේ 2013 නොවැම්බර් මස 23 සහ 24 දිනවල දී, ගාල්ලේ ලයිට්හවුස් හෝටලයෙහි ය. එහි මුඛ්‍ය අරමුණ වූයේ, ආයතනයට ඉමහත් සාර්ථකත්වයක් අත්කර ගැනීම පිණිස, වර්තමාන හා අනාගත අවශ්‍යතා සපුරනු සඳහා අවශ්‍ය වන පරිදි ආයතනය යළි ස්ථානගත කොට, අවශ්‍ය වන වර්ධනයන් ක්‍රියාත්මක කරවීමේ අපේක්ෂාවෙන්, ආයතනයේ සියලු වැදගත් ක්‍රියාකාරකම් හා මෙහෙයුම් පිළිබඳ ව දැන් පවත්නා තත්ත්වය විමර්ශනයට ලක් කිරීමයි. ඇත්ත වශයෙන්ම ඵලදායී ආචාර්ය මණ්ඩල වැඩ මුළුවකින් ආචාර්ය මණ්ඩල ප්‍රජාවට නව ජීවයක් ලබා දිය හැකි වන අතර, මනාව සංවිධානය කරන ලද වැඩ මුළුවක අන්තර්ගතයෙකින් ආයතනයේ අනන්‍යතා වර්ධනයට දායකත්වය සපයමින් පුනරාවර්තනයක්, හා ඉදිරි ගමනක් සඳහා පොදු ප්‍රබෝධයක් සැපැයිය හැකි යි. මෙ ම වර්ෂයෙහි දී පැවැති ආචාර්ය මණ්ඩල වැඩමුළුවෙන් මෙ ම අරමුණු බොහෝ දුරට ඉටු විය.

### ප්‍රවර්ධනයට අදාළ වන 5-M රාමුව

ඉදිරි වසරවල දී PIM ආයතනය ඉදිරියට රැගෙන යනු සඳහා, දැනටමත් යොදවා ගෙන ඇති පස්-විධ වැඩ සටහනට (Five Dimensional Programme) තව දුරටත් ජීවය ලබා දෙමින් ඉදිරියට ගෙන යන ලදි. 5-M හි නිරන්තර ව නියැලීම මීට අදාළ විය. 5-M නම්, වෙළෙඳ පොළ (Market) සාමාජිකයන් (Faculty and Staff) පසු විපරම් හා උපදේශකත්වය සඳහා පත් කරන ලද ආචාර්ය වරුන් (Mentors) එක් එක් ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා පත්කරන ලද පන්ති නායකයන් (Monitors) හා PIM ආයතනයේ උපාධිධරයන්ගේ සංගමය හෙවත් (PIMA) යි.

### PIM ආයතනය සඳහා ISO 9001-2008 තත්ත්වය ලබා ගැනීම

2012 වර්ෂය තුළ දී ලබා ගත් ඉ-වැදගත් ජයග්‍රහනයක් නම්, ආයතනය සඳහා ISO 9001-2008 සහතිකය ලබා ගැනීම යි. මේ දක්වා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයීය පද්ධතිය තුළ මෙ ම සහතිකය ලබා ගත් එක ම උසස් අධ්‍යාපන ආයතනය PIM වෙයි. මෙ ම සහතිකය හිමි කර ගැනීමේ ක්‍රියාවලිය ඉමහත් ප්‍රතිලාභ ගෙන දෙන කාර්යයක් වූයේ

ඉගැන්වීම, ඉගෙනගැනීම, හා ඇගැයීම මෙන් ම ආධ්‍යාපනික හා මූල්‍ය පරිපාලනය ඇතුළත් පොදු ආධ්‍යාපනික ක්ෂේත්‍රයෙහි ම ප්‍රතිඵලදායී වර්ධන හට ගත් නිසා යි.

**පුස්තකාලය පුළුල් කිරීම**

2013 වර්ෂය තුළ දී ද "වීඩියෝ" පුස්තකාලය ඇතුළු සමස්ථ පුස්තකාලය ව්‍යාප්ත කිරීමේ කටයුතු දිගට ම පැවැතිණි. මේ සඳහා රුපියල් දස ලක්ෂ 2ක මුදලක් වෙන් කරන ලදි. පර්යේෂණ එක්රැස් කිරීම, තොරතුරු ලබා දීමට සහාය වීම, අන්තර්-පුස්තකාල හුවමාරු, විෂය නාමාවලි සැකැසීම හා ඒවා ප්‍රදර්ශනය කිරීම, අන්තර්ජාල සම්බන්ධතාව හා යාන්ත්‍රික නාමාවලි-පද්ධතිය යන පහසුකම්ද, පුස්තකාලය පරිහරණය කරන්නන් වැඩි සංඛ්‍යාවක් රඳවා ගැනීමේ පහසුකම් ද ඇතුළත් වන පරිදි, පුස්තකාලය තව දුරටත් වර්ධනය කැරිණි.

2013 වර්ෂය අග දී, පාඨකයන් සඳහා, කළමනාකරණය හා ඊට සම්බන්ධිත විෂයයන් පිළිබඳ ව ග්‍රන්ථ 30,000කට අධික සංඛ්‍යාවක් ද, සඟරා 40 කට වැඩි සංඛ්‍යාවක් සපයන ලදි. පුස්තකාලය නවීකරණය කිරීමේ පියවරක් ලෙසින් ද කාර්යක්ෂම සේවාවක් සැපැයීමේ අරියෙන් ද, තීරු-සංකේත සංසරණ ක්‍රමය (Bar-Coded Circulation System) තව දුරටත් වැඩි දියුණු කරන ලදි.

**ආචාර්ය මණ්ඩලයත්ල කාර්ය මණ්ඩලයත්ල ශිෂ්‍යයනුත් සඳහා වැඩි දියුණු කළ පහසුකම්**

වඩා යහපත් පහසුකම් ශිෂ්‍යයන් වෙත ලබා දීමේ අරමුණින්ල මෙ ම වර්ෂය තුළ දීල පහතින් සඳහන් ලද පහසුකම් හඳුන්වා දෙන ලදි.

- ශාරීරික යෝග්‍යතා පුහුණු මධ්‍යස්ථානයː ඉතා වැදගත් වන කාර්ය ජීවිතය හා ඉගෙනීම අතර තිබිය යුතු සමතුලිතතාව ඇති කර ගැනීමට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි වැඩ සටහන් හදාරණ සැලැකිය යුතු ශිෂ්‍යයන් සංඛ්‍යාවකට හැකියාවක් නොපවතී. භෞතික, මානසික, සමාජයීය හා ආධ්‍යාත්මික නැමැති ජීවිතයෙහි චතුර්විධ පැතිකඩ නිසි ලෙස පාලනය කරගැනීමේ අවශ්‍යතාව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍යයන් අවබෝධකර ගත යුතු ව පවතී. මෙ ම අරමුණ ළඟා කරගැනීමට ඉවහල් වන ශාරීරික යෝග්‍යතා පුහුණු මධ්‍යස්ථානයට තව ද උපකරණ සපයමින්, මධ්‍යම රාත්‍රිය තෙක් එ ම පුහුණු මධ්‍යස්ථානය විවෘත ව තබමින් එහි කටයුතු තව දුරටත් වර්ධනය කරන ලදි.

- වෙබ් ජාලය පදනම් කරගෙන ශිෂ්‍ය-ප්‍රගතිය වාර්තා කිරීමේ ක්‍රමයː පාඨමාලාව තුළ එක්-එක් ශිෂ්‍යා ගේ ආධ්‍යාපනික ප්‍රගතිය, එක්-එක්

විෂයයට අදාළ පාඨමාලාව සම්බන්ධයෙන් ඔවුන් ලබා ගත් ලකුණුල විෂය මාලාවෙහි ලකුණුවල සාමාන්‍යය, අදාළ ශිෂ්‍ය කණ්ඩායමේ සෙස්සන් හා සාපේක්ෂ ව ලබා ගත් ලකුණු ප්‍රමාණය සහ හිමි වූ ස්ථානය යන දත්ත ලබා ගැනීමට එම්.බී.ඒ ශිෂ්‍යයන් සඳහා මෙ ම ක්‍රමය සකසන ලදි. මෙම වර්ෂය තුළ දී, උක්ත ක්‍රම-පද්ධතිය තව දුරටත් වර්ධනය කැරිණි.

- <u>රථ ගාල පුළුල් කිරීම</u>: කාර්යාලයීය වේලාවෙන් පසු සවස් වරුවේ දේශන සඳහා පැමිණෙන පශ්චාත් උපාධි ශිෂ්‍යයන් ගේ පහසුව තකා වැඩි වාහන සංඛ්‍යාවක් රැඳවීමට හැකි වන පරිදි රථගාල පුළුල් කරන ලදි.

- <u>නඩත්තු කටයුතු හා ආභ්‍යන්තරික වැඩිදියුණු කිරීම්</u>: කළමනාකරන පශ්චාත් උපාධි ආයතන ගොඩනැගිල්ල සුණු-පිරියම් කරන ලද අතර සියලු ක්ෂේත්‍රවල නඩත්තු කටයුතු තව දුරටත් සිදු කෙරිණි. එ මෙන් ම අවශ්‍යතා අනුව දේශනශාලා ද, ආචාර්ය මණ්ඩලයේ නිල-කාමර ද වැඩි දියුණු කරන ලදි. දේශනශාලා වලට ද, ශිෂ්‍ය-අධ්‍යයන ශාලාවලට ද අළුත් පුටු හා මේස සපයන ලදි. එ මෙන් ම, දේශනශාලාවල පැවැති ශබ්ද-විකාශන-පද්ධති ඉවත් කොට අළුත් විකාශන-පද්ධති සපයන ලදි.

- <u>තීරු සංකේත සංසරණ ක්‍රමයක් හඳුන්වා දීම (Bar-Coded Circulation System)</u>: මෙය හඳුන්වාදීමත් සමඟ ම, ශිෂ්‍යයන්ගේ පැමිණීම සටහන් කරන ලද ලේඛන-ක්‍රමය ඉවත් කැරිණි. ශිෂ්‍ය අධ්‍යයන පර්යන්ත (Student Learning Portal) ඔස්සේ ශිෂ්‍යයන්ගේ පැමිණීම දෛනික ව බලා ගැනීම සඳහා මෙ ම ක්‍රමය තව දුරටත් වර්ධනය කරන ලදි.

- <u>අන්තර්ජාලය ඔස්සේ සේවා හඳුන්වාදීම</u>: පාඨමාලා අධ්‍යයන නිබන්ධන, ආචාර්ය-මණ්ඩල පිළිබඳ ශිෂ්‍ය-ඇගැයීම් හා ශිෂ්‍යයන් ගේ විෂය-මාලා සම්බන්ධිත ලකුණු යාවත්කාලීන කිරීම මෙ ම ක්‍රම-පද්ධතිය (On-line) ඔස්සේ මෙ ම වසර තුළ දී තව දුරටත් ක්‍රියාත්මක විය. තවද හදිසි කරුණු පිළිබඳ ව ශිෂ්‍යයන් සමඟ අදහස් හුවමාරු කර ගැනීමේ අටියෙන් පුළුල් කෙටි පණිවුඩ පද්ධතියක් හඳුන්වා දෙන ලදි.

## PIM ගොඩනැගිලි ව්‍යාපෘතියේ II වන අදියර

2012 ජුනි මාසයේ දී, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන ගොඩනැගිලි සංකීර්ණයේ අදියර II පිළිබඳ ව්‍යාපෘති-යෝජනාව ගරු අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදි. ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් දස ලක්ෂ 171කි. මෑත අනාගතයෙහි දී මෙ ම ව්‍යාපෘතිය ඇරඹීමට ආයතනය බලාපොරොත්තු වන අතර, මෙ ම ගොඩනැගිල්ලෙහි සැලැකිය යුතු කොටසක් ආයතනය විසින් උපයා ගැනුණු අරමුදල උපයෝගී කොට ගෙන ඇරඹීමට අපේක්ෂා කෙරේ. මෙ ම

ගොඩනැගිල්ල සම්පූර්ණ වූ විට ශිෂ්‍යයන් මෙන් ම ව්‍යාපාරික ප්‍රජාව වෙත වඩා පුළුල් හා ව්‍යාප්ත වූ සේවාවක් ලබා දීමට ආයතනයට හැකි වනු ඇත.

**<u>ප්‍රචාරණය හා ප්‍රතිරූපය</u>**

2013 වසරෙහි දී ක්‍රියාත්මක කරන ලද සියලු කටයුතු ප්‍රචාරණය කරවීමට සැලැසුම්-සහගත ප්‍රයත්නයක් දරන ලදි. මින් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි දෘෂ්‍යභාවය පුළුල් විය. නිරන්තරයෙන් යාවත්කාලීන කෙරෙන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන වෙබ් අඩවියෙන් ද, ආයතනය විසින් මෙහෙයැවන විශේෂ අවස්ථා ආවරණය වේ.

**<u>අධ්‍යයන පහසුකම හඳුන්වා දීම</u>**

සජීවී දේශන මෘදුකාංග උපයෝගී කොට ගෙන අන්තර්ජාලය ඔස්සේ MPA ශිෂ්‍යයනට දේශනවලට සහභාගී වීම පහසු කරවීම සඳහා PIM ආයතනය විසින් සීමාසහිත මොබිටෙල් පෞද්ගලික සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි. මෙම සජීවී දේශන පහසුව නිසා, වීඩියෝ, පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම් වැනි බහු මාධ්‍ය ඔස්සේ සමගාමීව සජීවී දේශන විකාශනය කිරීමට හැකි වී ඇත.

## 9. මානව සම්පත් සංවර්ධනය

මෙම වර්ෂය තුළ දී, ආයතනික අරමුණු ළඟා කර ගැනීමට ආචාර්ය මණ්ඩලය මෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද ඉමහත් සේවාවක් සැපැයූහ.

### (i) ආචාර්ය මණ්ඩල සම්පත්

දස වර්ෂ තුනකට වැඩි කාල පරිච්ඡේදය තුළ දී, වැඩිහිටි අධ්‍යාපනයත්, එ මෙන් ම, පර්යේෂණ කටයුතු හා උපදේශන සේවා සම්බන්ධයෙන් අත්දැකීම් සම්භාරයක්, ආයතනය විසින් එක් රැස් කැරිණි. අද ආයතනයේ සිටින, ආචාර්ය මණ්ඩලයේ බොහෝ දෙනකු සිය කාර්යවල සැලැකිය යුතු අවුරුදු ගණනක් තුළ නියැලී සිටින හෙයින්, ඔව්හු අවශ්‍ය සම්මත තීරණය කරමින්ද පාඨමාලාවලට තිරසාරයෙන් ම දේශීය ව උකහාගත් දැනුම බද්ධ කරමින් ද, ඉක්මන් ව නම්‍යතාවෙන් යුතු ව ආචාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයන් හා කටයුතු සම්බන්ධීකරණය කෙරෙමින් හරවත් මධ්‍යගත කණ්ඩායමක් බවට පත්ව සිටිති. විද්‍යාපති හා විද්‍යාශූරී මට්ටම්වල ශිෂ්‍යයන්ගේ පර්යේෂණ නිබන්ධන හා කුසලතා-වර්ධන ව්‍යාපෘති සුපරීක්ෂණය කෙරෙමින් ආචාර්ය මණ්ඩලය පාඨමාලා මෙහෙයැවීමෙහි යෙදී සිටියහ.

*අංක 5 වගුව ඊ ආචාර්ය මණ්ඩලය*

| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | උපදේශකවරු | බාහිර උපදේශකවරු |
|---|---|---|---|---|---|
| | | 02 | | 05 | 30 |
| **එකතුව** | | 02 | | 05 | 30 |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

මෙම ආචාර්ය මණ්ඩලය ස්ථිර, කොන්ත්‍රාත් පදනම මත හා බාහිර ආචාර්යවරු මෙන් ම වෘත්තිකයන් ගෙන් සමන්විත වේ.

ආචාර්ය අරෝෂ අදිකාරම් මහතා
Dr. Arosha Adikaram
*BBA (Col.), MA (Col), Ph.D. (Col.)*

ඉන්ද්‍රජිත් අපොන්සු මහතා
Mr. Indrajit Aponso
*B.Sc. (Col.), MA (Col.), M.Phil. (Hong Kong)*

සිසිර අතුරලියගේ මහතා
Mr. Sisira Athuraliyage
*B. Sc.Natural.Sc. (Ruhuna), M. Sc. Comp, Sc (Col.)*

ආචාර්ය ට්‍රෙසි කාටර් මිය
Dr. Traci Carte
*B.Sc. (Wright State), mba, ph. D. (Georgia)*

අරුණ දයානාත මයා
Mr. Aruna Dayanatha
*MBCS (UK), AMIPM (SL), MACS (AUS), MBA (PIM-USJ)*

ගයනි ද අල්විස් මිය
Ms. Gayani De Alvis
*MCILT (UK), MBA (PIM-USJ), MSC (Reading)*

ආචාර්ය අජන්ත එස්. ධර්මසිරි මහතා
Dr. Ajantha Dharmasiri
*B. Sc.Eng (Moratuwa), MBA (PIM-USJ), Ph.D. (PIM-USJ), C.Eng. MIE (SL)*

සකුන්තලා දූරෛරත්නම් මිය
Ms.Sakunthala Durairatnam
*BSc (Pera), MSc (USJ), MBA (PIM- USJ), M.Ichem (SL)*

රවී එදිරිසිංහ මහතා
Mr. Ravi Edirisinghe
*MBA (PIM-USJ), ACMA (UK), FSCMA*

මහාචාර්ය ඩේවිඩ් එවන්ස් මහතා
Prof. David Evans,
*BA (Hons.), M Sc, Dip.Ed.*

හර්ෂ ප්‍රනාන්දු මහතා
Mr Harsha Fernando
*LLM (Lond.), MBA (Nanyang), Att-at-Law*

ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු මහතා
Dr; Lloyd Fernando
*M. Sc. (Moscow), Ph.D. (Sussex)*

මහාචාර්ය මංගල ෆොන්සේකා මහතා
Prof. Mangala Fonseka
*B Sc, MBA (Col.), FCMA (UK)*

මාරියෝ ෆොන්සේකා මහතා
Mr. Mario Fonseka
*MCIM (UK), FSCMA, MBA (PIM-USJ)*

මහාචාර්ය තිලක් ෆොන්සේකා මහතා
Prof. Tilak Fonseka
*BA. (Cey.). L.L.B (Col.), MBA (PIM-USJ), MA (Col.), Ph.D. (PIM-USJ) Att-at-Law*

ආචාර්ය පෙනිලොපි හුඩ් මිය
Dr. Penelope Hood
*DMS (Ed), M. Sc. (Edu.Mgt.) Ph D. (Anglia)*

මෆාස් ඉෂාක් මහතා
Mr. Mafaz Ishaq
*B Sc. (Eng.), M. Sc. (Econ) M Sc.(Eng), CISA*

සංජීව් ජයරත්නම් මහතා
Mr. Sanjeev Jayaratnam
*C.Eng.MBCS, B. Sc.(Manchester), MBA (PIM-USJ)*

තිස්ස ජයතිලක මහතා
Mr. Tissa Jayathilaka
*BA (Cey), MA (Wake), MPA (Sri J.)*

ආචාර්ය ඒ. කේ. එල්. ජයවර්ධන මහතා
Dr. A. K. L. Jayawardana
*B. Tech (Mad.), MBA (PIM-USJ), Ph.D. (Canb.)*

කේ. ඒ. අයි. කල්‍යාණරත්න මහතා
Mr. K. A. I. Kalyanaratne
*BA (Cey.), MBA/HRM (PIM-USJ), ACIT (UK)*

මහාචාර්ය උදිත ලියනගේ මයා
Prof. Uditha Liyanage
Dip.M, FCIM, MBA (PIM-USJ), PhD (PIM-USJ)

එන්. නිර්මලන් මහතා
Mr. N. Nirmalan
*MPM (USQ), B. Sc (Hons) Comp & IS (LGU), MCS (SL)*

මහාචාර්ය හෙනරත් ඕපාත මහතා
Prof. Henerath Opatha
*B. Sc (Bus. Adm) (USJ), M. Sc (HRM) (USJ), MBA (Birmingham), Ph.D. (UUM), Doc. HRM (IIU)*

ආචාර්ය ට්‍රැවිස් පෙරේරා මහතා
Dr. Travis Perera
*MIED (UK), MBA (PIM-USJ), Ph.D. (PIM-USJ)*

වෙලිංටන් පියදාස මහතා
Mr. Wellington Piyadasa
*FCMA, FPFA, P.G.Dip.M.P. (UCD), P.G.Dip.SCF (ICASL), MBA(UCD)*

කාර්ල්ටන් සමරජීව මහතා
Mr. Carlton samarajiwa
*BA (Cey.), B.Ed (Queensland), Dip.Ed. (London), Dip. TEFL (Sydney)*

මහාචාර්ය සතිෂ් ෂින්දි
Prof. Satis Shinde
M Sc. MBA, Ph.D. (Pune)

ආචාර්ය අරුල් සිවගනනාදන් මහතා
Dr. Arul Sivaganatha
B.Eng. (Hons) (London), AMIE (SL), FCMA (UK), MBA (Cranfield), Ph. D. (USA)

ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා
Dr. Wickrema Weerasooriya
L.L.B. (Pera.), Ph.D. (London) Att-at-Law

සේනක වීරසූරිය මහතා
Mr. Senaka Weerasooriya
B Sc. (ANU), MIT (Canberra)

සුනිල් විජේසිංහ මහතා
Mr. Sunil Wijesinghe
FCMA, C.Eng. MBA (PIM-USJ)

## අනධ්‍යයන කාර්ය-මණ්ඩලය පිළිබඳ විස්තරය

මෙම වර්ෂය තුළ දී ද, ආයතනයේ පූර්ණ කාලීන කාර්ය-මණ්ඩලය 28 දෙනකුගෙන් සමන්විත විය. සනීපාරක්ෂක, පිරිසුදු කිරීම්, ආරක්ෂක හා ආපනශාලා සේවා බාහිර ආයතනවලට පවරන ලදි.

වගුව අංක 06හි අනධ්‍යයන කාර්ය-මණ්ඩලයේ විස්තර දැක්වේ.

***අංක 6 වගුව : අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර***

| පීඨය / ශාඛාව | වඩා ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| පරිපාලන හා අධ්‍යයන කටයුතු | - | 01 | 05 | 03 |
| පරිගනක මධ්‍යස්ථානය | - | 01 | - | 01 |
| පුස්තකාලය | - | 01 | 04 | - |
| අධ්‍යක්ෂක කාර්යාලය | 01 | - | 01 | - |
| පුහුණු හා ප්‍රකාශන | 01 | - | 01 | - |
| පොදු-පිළිවෙත් කොට්ඨාශය | 01 | 01 | 02 | - |
| මූල්‍ය | 01 | - | 03 | - |
| **එකතුව** | 28 | | | |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

## 10. පරිපාලන හා මූල්‍ය කාර්යක්ෂමතාව

පහතින් වන සටහනින් දැක්වෙන පරිදි මෙ ම වර්ෂයේ පරිපාලන හා මූල්‍ය ක්ෂේත්‍රවල සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කළේ ය. සාපේක්ෂ පුනරාවර්තන වියදම් සංඛ්‍යා වගුව අංක 7හි දැක්වේ.

***අංක 7 වගුව : පුනරාවර්තන වියදම්***

| විෂයය | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| අ). පුද්ගල වැටුප් හා දීමනා | 27,170,448 | 34,743,448 | 37,450,350 |
| ආ). ගමන් වියදම් | 3,332,150 | 2,367,507 | 1,263,175 |
| ඇ). සැපැයුම් | 7,509,525 | 8,863,732 | 11,812,206 |
| ඈ). නඩත්තු | 3,181,931 | 4,032,681 | 4,864,374 |
| ඉ). කොන්ත්‍රාත් සේවා | 17,360,808 | 18,952,907 | 25,263,530 |
| ඊ). සෙසු | 35,279,370 | 40,261,864 | 23,947,168 |
| උ). ව්‍යාපෘතිවලට අදාළ වියදම් | 29,752,511 | 20,775,283 | 33,689,780 |
| **වියදම්හි එකතුව** | **123,566,788** | **129,727,425** | **138,290,583** |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

සාපේක්ෂ මූල්‍යධන වියදම් සංඛ්‍යා අංක 8 වගුවෙහි දැක්වේ

***අංක 8 වගුව ඊ මූල්‍යධන වියදම්***

| **විෂය විස්තර** | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| අ). දැව භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිල දී ගැනීම් | 4,535,905 | 4,885,334 | 6,147,596 |
| ආ). යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම් | 5,676,652 | 5,676,652 | - |
| ඇ). ගොඩනැගිලි හා ඉදිකිරීම් අත්පත්කර ගැනීම් | - | - | - |
| ඈ).සෙසු/ පුස්තකාල පොත්, උපාධි ලෝගු | 649,320 | 1,193,395 | 2,117,571 |
| ඉ). ඉඩම් හා ගොඩනැගිලි පුනුරුත්ථාපන හා නවීකරණය | 282,373 | 393,400 | 2,660,542 |
| **එකතුව** | **11,144,250** | **6,474,129** | **10,925,707** |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

*අංක 9 වගුව : ව්‍යාපෘති (අභ්‍යන්තර ප්‍රතිපාදන මගින්)*

| Name & Detail | ණය ප්‍රදානය | ප්‍රතිපාදන සැපැයීම | TCE Rs. | RFA රු. | DF රු. |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

සාපේක්ෂව අභ්‍යන්තර ප්‍රතිපාදන මගින් සිදුකළ ව්‍යාපෘතිවල වියදම් වගු අංක 10හි දැක්වේ.

*අංක 10 වගුව : ව්‍යාපෘති වියදම් (අභ්‍යන්තර ප්‍රතිපාදන මගින්)*

| Name & Detail නම | ඇස්තමේන්තු කළ මුළුවියදම | 2012 වියදම් | 2013 වියදම් | 31.12.2013 දක්වා සමස්ථ එකතුව | භෞතික ප්‍රගතියේ % |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

වියදම් පිළිබඳ සාපේක්ෂ මූල්‍ය ප්‍රගතිය වගු අංක 11හි දැක්වේ.

*අංක 11 වගුව : මූල්‍ය ප්‍රගතිය (වියදම්)*

| විෂයය | 2013 හි ප්‍රතිපාදන (රු.) | 2013 හි වියදම් (රු.) | ඉතිරිය / ඉක්මවීම (රු.) |
|---|---|---|---|
| අ). පුණරාවර්තන - ව්‍යාපෘති හැර | 131,858,000 | 138,290,583 | 6,432,583 |
| ආ). ප්‍රාග්ධන - ව්‍යාපෘති හැර | 11,500,00 | 10,925,709 | 574,291 |
| ඇ). ව්‍යාපෘති - දේශීය අරමුදලින් | - | - | - |
| ඈ). ව්‍යාපෘති - විදේශීය අරමුදලින් | - | - | - |
| **එකතුව** | **143,350,000** | **149,216,292** | **5,858,292** |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

උත්පාදිත ආදායම පිළිබඳ සාපේක්ෂ මූල්‍ය ප්‍රගති පිළිබඳ සංඛ්‍යා වගුව අංක 12හි දැක්වේ.

*අංක 12 වගුව : මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම)*

| මූල්‍ය උත්පාදනය | 2014 හි සැපයුම (රු.) | 2014 එකතුව (රු.) | හර / බැර (රු.) |
|---|---|---|---|
| අ). උපාධි අපේක්ෂක අධ්‍යයන | - | - | - |
| ආ). පශ්චාත් උපාධි අධ්‍යයන | 111,600,000 | 112,037,800 | 437,800 |
| ඇ). උපදේශන සේවා | 20,000,000 | 15,257,175 | (4,742,825) |
| ඈ). සෙසු | 56,124,000 | 49,168,517 | (6,955,483) |
| **එකතුව** | **187,724,000** | **176,463,492** | **(11,260,508)** |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

## 2013 මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විග්‍රහය

1997 වසරෙහි දී අරම්භ කරන ලද ආයතනයේ ආදායම් පිළිබඳ ස්ව-උත්පාදන පිළිවෙත අනුව මෙම වර්ෂය තුළ දීල රජයේ මූල්‍ය-ආයතන වලින් කිසිදු අරමුලක් (පුනරාවර්තන) ආයතනයට නොලැබිණි. එම වසරේ සිට, එ නම් 1997හි සිට, පුනරාවර්තන වියදම් සඳහා මධ්‍ය-භාණ්ඩාගාරයෙන් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් හෝ කිසිදු අරමුදලක් පශ්චාත් උපාධි ආයතනයට ලැබී නොතිබිණි.

2014 මූල්‍ය-ක්‍රියාකාරීත්වය පිළිබඳ විග්‍රහය වගු අංක 13හි දැක්වේ.

*අංක 12 වගුව : මූල්‍ය ප්‍රගතිය විග්‍රහය (උත්පාදිත ආදායම)*

| විෂයය | නිර්ණායකය | එක් ශිෂ්‍යයකු සඳහා වියදම (රු) |
|---|---|---|
| අ). එක් ශිෂ්‍යයකු සහා පුනරාවර්තන වියදම | පූර්ව / මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව | 204, 875 |
| ආ). එක් ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාග් / මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව | 16,186 |
| එකතුව | | |

*දත්ත මූලය : PIM දත්ත පදනම*

## 11. කළමනාකරණ මණ්ඩල හා අධ්‍යයන මණ්ඩලය

**කළමනාකරණ මණ්ඩලය: පහතින් දැක්වෙන කළමනාකරණ මණ්ඩලය ආයතනයේ අධ්‍යයන හා විධායක මණ්ඩලය වේ.**

**නිල-බලයෙන් පත් කැරුණු සාමාජිකයෝ**

මහාචාර්ය K.M.B පොන්සේකා මහතා, අධ්‍යක්ෂක සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති (2014 ජූලි දක්වා)

මහාචාර්ය අජන්ත ධර්මසිරි මහතා, අධ්‍යක්ෂක සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති (2014 ජූලි සිට)

ලේකම්ල උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (නියෝජනය පියසේන රණේපුර මහතා)

ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (BPPS අබේගුණවර්ධන මහතා)

ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (නියෝජනය M. ගොඩකන්ද මහත්මාව)

අධක්ෂ ජනරාල්, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය (ආචාර්ය ඊ. ඒ. වීරසිංහ මහතා)

සභාපති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (අර්ජුන හේරත් මහතා)

සභාපති, ඉංජිනේරු ආයතනය (ආචාර් H.B. විජේකෝන් මයා)

සභාපති, ශ්‍රී ලංකා වානිජ මණ්ඩලය (සුරේෂ් ෂා මහතා)

පීඨාධිපති, කළමනාකරණ හා වානිජ විද්‍යා පීඨයල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (ආචාර්ය U. අනුර කුමාර මහතා)

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (J. අඩල්ලගේ මහතා)

**විශ්ව විද්‍යාල සනාථන සභාවෙන් පත් කරන ලද සාමාජිකයන්**

මහාචාර්ය අබේරත්න බණ්ඩාර මහතා, මූල්‍ය අධ්‍යයන අංශයල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

ටී. ධර්මරාජා මහතා, පාලක සභා සාමාජිකල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

ආචාර්ය එච්. එම්. ඒ. හේරත් මහතා, රාජ්‍ය පරිපාලන අධ්‍යයන අංශයල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

මහාචාර්ය එච්. එච්. ඩි. එන්. පී. ඔපාත මහතා, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශයල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

විශ්ව විද්‍යාල කොමිෂන් සභාවෙන් පත් කරන ලද සාමාජිකයන්

හුසේන් එන්. එසුෆාලි මහතා, සභාපති, හේමාස් හෝල්ඩින්ග්ස් පී. එල්. සී.

බී. ආර්. එල්. ෆනැන්ඩු මහතා, සභාපති, සී අයි සී හෝල්ඩින්ග්ස් පී. එල්. සී.

මහාචාර්ය H. අබේවර්ධන මහතා (සාමාජික විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම)

ආචාර්ය සමන් කැලෑගම මහතා, අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා, ශ්‍රී ලංකාවේ රක්ෂණ ඔම්බුඩ්ස්මන් වරයා

## 12. අධ්‍යයන මණ්ඩලය

ඉගැන්වීම, පරීක්ෂණය හා පර්යේෂණ සම්බන්ධිත කටයුතු වසර තුළදී හසුරුවන ලද්දේ ආයතනයේ අධ්‍යයන මණ්ඩලය විසිනි. එම මණ්ඩලය පහතින් දැක්වෙන සාමාජිකයන් ගෙන් සමන්විත විය.

**ව්‍යාපාර පරිපාලන අධ්‍යයන මණ්ඩලය**

මහාචාර්ය K.M.B පොන්සේකා මහතා, අධ්‍යක්ෂක සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති (2014 ජූලි දක්වා)

මහාචාර්ය අජන්ත ධර්මසිරි මහතා, අධ්‍යක්ෂක සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති (2014 ජූලි සිට)

මහාචාර්ය සම්පත් අමරතුංග මහතා, පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වානිජ විද්‍යා පීඨයල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

අර්ඩිලි පෙරේරා මහතා, අධ්‍යක්ෂ, ඩුනමිස් කැපිටල් පී. එල්. සී.

ආචාර්ය ට්‍රැවිස් පෙරේරා මහතා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ උපදේශක, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

එම්. ආර්. ප්‍රෙලිස් මහතා, සමාගම් අධ්‍යක්ෂ

**රාජ්‍ය පරිපාලන පිළිබඳ අධ්‍යයන මණ්ඩලය**

මහාචාර්ය K.M.B පොන්සේකා මහතා, අධ්‍යක්ෂක සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති (2014 ජූලි දක්වා)

මහාචාර්ය අජන්ත ධර්මසිරි මහතා, අධ්‍යක්ෂක සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති (2014 ජූලි සිට)

මහාචාර්ය ඒ. කේ. ඩබ්. ජයවර්ධන මහතා, උප කුලපති, මොරටුව විශ්ව විද්‍යාලයය

ආචාර්ය ලොයිඩ් ෆනැන්ඩු මහතා, වැඩසටහන් අධ්‍යක්ෂ, (රාජ්‍ය ප්‍රතිපත්ති), කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා, ජනාධිපති නීතිඥ

ආචාර්යල වික්‍රම වීරසූරිය මහතා, ශ්‍රී ලංකාවේ රක්ෂණ ඔම්බුඩ්ස්මන් වරයා

W.A. විජේවර්ධන මයා, මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිව සිටි

## 13. මතු සැලැසුම්

ශිෂ්‍යයන් ගේ පර්යේෂණ නිබන්ධනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය වැඩි අවධානයක් යොමු කළ යුතු ය. එ මෙන් ම ගුණ-විෂයක (Qualitative) හා මිශ්‍ර පර්යේෂණ ක්‍රම පිළිබඳ ව ශිෂ්‍යයන් ද දැනුම්වත් කළ යුතු ය. Sri Lankan Journal of Management පර්යේෂණ සංග්‍රහය අදාළ ජාත්‍යාන්තර මට්ටමට උසස් කරවීමට ද විශේෂ ප්‍රයත්නයක් දැරිය යුතු ය. මෙහි-ලා ආචාර්ය මණ්ඩලයේ පර්යේෂණ නිබන්ධනවල ගුණය ඉහළ නැංවීම වැදගත් බව පෙනී යයි. මේ අනුව ආයතනය තුළ පර්යේෂණ ඒකකයක් පිහිටුවීම දැඩි අවශ්‍යතාවක් ව පවතී.

තව ද, ආයතනය විසින් පැවැත්වෙන MPA පාඨමාලාවන්හි අන්තර්ගතය හා දේශන ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට ප්‍රයත්නයක් දැරිය යුතුය. මෙහි-ලා, තොරතුරු තාක්ෂණය උපයෝගී කරගනිමින්, මිශ්‍ර ඉගැනුම් ක්‍රමවේද භාවිත කිරීම ප්‍රයෝජනවත් බව පෙනීයනුයේ රටේ ඈත ප්‍රදේශවල සිටින ශිෂ්‍යයන්ගේ සහභාගිත්වය ඉන් තහවුරු වන බැවිනි.

වර්ධනය වන තරගකාරිත්වය මධ්‍යයේ, PIM ආයතනය හා එහි ප්‍රමුඛ වන MBA පාඨමාලා වසර ගණනක් පුරා තරගකාරී ව පවත්වාගෙන යෑමට හැකි වී ඇත. තෝරා ගන්නා ලද ක්ෂේත්‍රවල, එ නම්, ප්‍රමුඛ පාඨමාලා වන MBA, MPA හා PhD සමඟ පර්යේෂණ ක්ෂේත්‍රයෙහි ද, විශිෂ්ටත්වයට පත්වීම ආයතනයේ අඛණ්ඩ ප්‍රයත්නය වේ. මෙහි-ලා, විශේෂයෙන් ම පෞද්ගලික අංශයේ විශේෂ පුහුණු හා සංවර්ධන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි, විධායක ප්‍රවර්ධන වැඩ සටහන් (Executive Development Programmes) (EDP) කෙරෙහි වැඩි අවධානයක් රැඳවීම ද ආයතනයෙහි ප්‍රයත්නය වී ඇත. යටිතල පහසුකම් සංවර්ධනයත්, එ මෙන් ම ආචාර්ය මණ්ඩලය පුළුල් කොට, ඔවුන් ගේ අඛණ්ඩ ප්‍රවර්ධනයත්, ඉහතින් සඳහන් කරන ලද පාඨමාලා, පර්යේෂණ හා පුහුණු කටයුතු සැලැසුම් කරන ලද පරිදි, ක්‍රියාත්මක කරවීමට ඉවහල් වනු ඇත.

ආචාර්ය අජන්ත ධර්මසිරි

වැඩ බලන අධ්‍යක්ෂ
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

2015 දෙසැම්බර් 31

## කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය
## 2014-දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල්)

| | 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
|---|---|---|
| **අයභාරය** | | |
| ලියාපදිංචි ගාස්තු | 850,793.00 | 96,650.00 |
| ඉගැන්වීම් ගාස්තු | 112,037,800.00 | 90,399,979.75 |
| විභාග ගාස්තු | 540,200.00 | 612,275.00 |
| කළමනාකරණ සංවර්ධන වැඩ සටහන් | 15,257,175.00 | 13,654,987.50 |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 6,955,300.00 | 14,603,310.00 |
| අයදුම්පත් ගාස්තු | 801,900.00 | 533,000.00 |
| උපාධි ප්‍රදානෝත්සව ගාස්තු | 4,198,000.00 | 4,820,000.00 |
| | **140,641,168.00** | **124,720,202.25** |
| **වෙනත් ආදායම්** | | |
| ආයෝජන පොලී | 17,361,723.50 | 22,671,238.58 |
| ණය අත්තිකාරම් පොලී | 94,461.81 | 82,061.89 |
| දේශන ශාලා කුලී ආදායම් | 14,843,405.00 | 12,149,925.00 |
| වත්කම් විකිණීමෙන් වූ අතිරික්තය/ඌනතාවය | (561,445.00) | 113,050.00 |
| විදේශ විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීමෙන් වූ බලපෑම | (3,428.94) | 29,956.85 |
| ප්‍රධාන නව්‍යකරන නිලධරයන් සඳහා වූ ව්‍යාපෘතිය | - | 1,375,000.00 |
| ප්‍රකාශන විකුණුම් | 557,410.00 | 1,932,400.00 |
| පුස්තකාල දඩ මුදල් හා ගාස්තු | 175,965.00 | 155,562.50 |
| ව්‍යාපාර නායකයින් සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති පාඨමාලාව | 935,000.00 | 1,980,000.00 |
| පර්යේෂණ වැඩමුළුව | 30,000.00 | 100,000.00 |
| විවිධ ආදායම් | 2,389,233.09 | 5,202,315.94 |
| | **35,822,324.46** | **45,791,510.76** |
| **පරිපාලන වියදම්** | | |
| පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා | 54,446,264.85 | 48,517,182.97 |
| අධ්‍යයන සේවා | 43,498,719.04 | 38,023,856.24 |
| ඉගැන්වීමේ සම්පත් | 3,061,395.30 | 5,019,540.10 |
| උපකාරක ක්‍රියාකාරකම් | 3,594,424.77 | 3,785,460.38 |
| කළමනාකරණ සංවර්ධන වැඩසටහන් | 9,502,373.00 | 10,768,067.95 |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 4,672,269.51 | 6,347,835.60 |
| ප්‍රධාන නව්‍යකරන නිලධාරීන් සඳහා වූ පාඨමාලාව | - | 1,818,845.60 |
| ප්‍රකාශන වියදම් | 914,737.92 | 612,793.07 |
| ව්‍යාපාර නායකයින් සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති පාඨමාලාව | 401,276.40 | 1,716,135.00 |
| පර්යේෂණ වැඩමුළුව | - | 124,400.00 |
| බොල් ණය | 1,882,500.00 | - |
| ක්ෂයවීම් | 16,316,622.65 | 12,805,830.19 |
| වෙනත් වියදම් | - | 187,478.14 |
| | **138,290,583.44** | **129,727,425.24** |
| **ප්‍රත්‍යාංගණනයට පෙර අතිරික්තය** | **38,172,909.02** | **40,784,287.77** |
| **වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය** | 10,661,270.38 | - |
| **වත්කම් ප්‍රත්‍යාගණනයට පසු අතිරික්තය** | **48,834,179.40** | **40,784,287.77** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය**
2014-දෙසැම්බර් 31 දිනට

( ශ්‍රී ලංකා රුපියල් )

| | සටහන් | 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 12 | 70,239,907.38 | 65,715,876.74 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 13 | 4,407,486.21 | 5,079,790.68 |
| ණයගැතියෝ | | 1,641,000.00 | 1,641,000.00 |
| සේවක ණය හා අත්තිකාරම් | 14 | 2,665,453.05 | 2,399,094.39 |
| අත්තිකාරම් | | 3,870,000.00 | 7,500.00 |
| කලින් ගෙවීම් | | 143,010.40 | 175,855.36 |
| තැන්පතු | 15 | 6,274,525.31 | 11,715,884.34 |
| ස්ථාවර තැන්පතු | 16 | 246,290,062.60 | 201,625,919.11 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 17 | 13,941,116.66 | 27,836,354.56 |
| **මුළු වත්කම්** | | **349,472,561.61** | **316,197,275.18** |
| **ස්කන්ධය හා බැරකම්** | | | |
| **ස්කන්ධය** | | | |
| ප්‍රාග්ධනය | | 166,986,089.57 | 166,986,089.57 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 10,661,270.38 | - |
| පොදු සංචිතය | | 63,569,358.60 | 25,342,621.58 |
| පරිත්‍යාග සංචිතය | | 2,036,493.97 | 2,036,493.97 |
| අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල | 18 | 378,655.94 | 365,555.54 |
| **මුළු ස්කන්ධය** | | **243,631,868.46** | **194,730,760.66** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 8,542,648.94 | 8,138,105.03 |
| **ජංගම බැරකම්** | | | |
| කලින් ලැබූ ආදායම් | 19 | 70,398,955.00 | 92,012,220.00 |
| තැන්පතු ලැබීම් | 20 | 1,099,260.51 | 1,919,260.51 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 21 | 25,799,828.56 | 19,396,928.98 |
| **මුළු ජංගම බැරකම්** | | **97,298,044.07** | **113,328,409.49** |
| **මුළු ස්කන්ධය සහ බැරකම්** | | **349,472,561.47** | **316,197,275.18** |

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ හා 1985 අංක 03 දරණ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කොට ඇති බව සහතික කරමු.

........................
පී.ජී. මෛත්‍රීරත්න
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

..........................
ආචාර්ය අජන්ත එස්. ධර්මසිරි
අධ්‍යක්ෂ

..........................
ජේ.කේ.එස් රණපුර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය**
**2014-දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

*(ශ්‍රී ලංකා රුපියල් )*

| | ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිතය | පොදු සංචිතය | පරිත්‍යාග සංචිතය | මුළු අගය |
|---|---|---|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 166,986,089.57 | - | (15,441,666.19) | 2,036,493.97 | 153,580,917.35 |
| වර්ෂයේ අතිරික්තය | - | | 40,784,287.77 | - | 40,784,287.77 |
| 2013-දෙසැම්බර් 31 දිනට ශේෂය | **166,986,089.57** | - | **25,342,621.58** | **2,036,493.97** | **194,365,205.12** |
| වර්ෂයේ අතිරික්තය | - | - | 38,172,909.02 | - | 38,172,909.02 |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | | | 53,828.00 | | 53,828.00 |
| වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය | | 10,661,270.38 | | | 10,661,270.38 |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | **166,986,089.57** | **10,661,270.38** | **63,569,358.60** | **2,036,493.97** | **243,253,212.52** |

# කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
## 2014-දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල්)

| | 2014 දෙසැම්බර් 31, | 2013 දෙසැම්බර් 31, |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | |
| අතිරික්තය | 38,172,909.02 | 40,784,287.77 |
| ගැළපුම්: | | |
| ක්ෂයවීම | 16,316,622.65 | 12,805,830.19 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | 404,543.91 | 880,933.84 |
| වත්කම් විකිණීමෙන් ඇතිවූ ඌනතාවය | 561,445.00 | - |
| ණය හා අත්තිකාරම් සඳහා පොලී | (94,461.81) | (82,061.89) |
| ආයෝජන පොලී | (17,361,723.50) | (22,671,238.58) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් ගැළපීමට පෙර මෙහෙයුම් අතිරික්තය** | **37,999,335.27** | **31,717,751.33** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| තොග වැඩිවීම් / අඩුවීම් | 672,304.47 | (3,288,553.70) |
| විවිධ අත්තිකාරම් වැඩිවීම් / අඩුවීම් | (3,863,200.00) | 914,500.00 |
| කලින් ගෙවීම් වැඩිවීම් / අඩුවීම් | 32,844.96 | 1,587,710.26 |
| විවිධ ණයගැතියන් වැඩිවීම් / අඩුවීම් | 5,078,441.35 | (62,883.62) |
| තැන්පතු ලැබීම් වැඩිවීම් / අඩුවීම් | (820,000.00) | (1,564,707.14) |
| උපචිත වියදම් වැඩිවීම් / අඩුවීම් | 4,013,357.31 | (401,574.91) |
| කලින් ලැබූ අදායම් වැඩිවීම් / අඩුවීම් | (21,613,265.00) | 16,754,623.62 |
| වෙනත් වගකීම් වැඩිවීම් / අඩුවීම් | 2,389,542.27 | (3,568,134.10) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **23,889,360.63** | **42,088,731.74** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | |
| ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගැනීම් | - | (393,400.00) |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ මිලදී ගැනීම් | (1,390,071.08) | (585,625.00) |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන මිලදී ගැනීම් | (727,499.95) | (1,193,394.50) |
| කාර්යාල ලී බඩු හා උපකරණ මිලදී ගැනීම | (8,635,533.74) | (4,299,709.26) |
| වත්කම් විකිණීමෙන් ලැබීම් | 66,805.00 | - |
| ණය හා අත්තිකාරම් අඩුවීම | (266,358.66) | (212,132.78) |
| ආයෝජන | (44,301,225.81) | (55,128,707.51) |
| ණය හා අත්තිකාරම් පොලී | 94,461.81 | 82,061.89 |
| ආයෝජන පොලී | 17,361,723.50 | 22,671,238.58 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **(37,797,698.93)** | **(39,059,668.58)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | |
| අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල | 13,100.40 | 13,100.40 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **13,100.40** | **13,100.40** |
| වර්ෂය තුළ මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වෙනස්වීම | (13,895,237.90) | 3,042,163.56 |
| වර්ෂය ආරම්භයේ වූ මුදල් හා මුදල් හා සමාන දෑ | 27,836,354.56 | 24,794,191.00 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ** | **13,941,116.66** | **27,836,354.56** |

| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ වලින් නියෝජනය කරන්නේ | 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
|---|---|---|
| | | |
| බැංකුවේ පවතින මුදල් | 13,941,116.66 | 27,836,354.56 |
| | 13,941,116.66 | 27,836,354.56 |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය/ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්**
**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

1. **වාර්තාකරන ඒකකය**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත අර්ධ-ස්වාධීන ආයතනයක් වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ වූ නියමාවලියක් මගින් 1987 දී ස්ථාපිත කරනු ලැබීය.

එහි අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ උසස් කළමනාකරණ අධ්‍යාපනය හා වෘත්තීයතාවය ප්‍රවර්ධනය කිරීමයි. එම අරමුණ සාක්ෂාත් කරගැනීමට කළමනාකරණයේ හා පරිපාලනයේ විවිධ අංශවල පශ්චාත් උපාධි සඳහා ඉගැන්වීම, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධනය යන මාර්ග යොදාගැනේ.

සිසුන් 500 කට අධික සංඛ්‍යාවකට එකවර අධ්‍යාපනය ලබා දිය හැකි මෙම ආයතනය දේශන ශාලා, අධ්‍යයන කාර්ය මණ්ඩල කාමර, තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය, පුස්තකාලය හා ආපනශාලාව යන පහසුකම් වලින් සමන්විත වේ. ආයතන පරිශ්‍රය, දේශන ශාලා මෙන්ම අධ්‍යාපන උපකරණ ඉහළ ගුණාත්මක තත්ත්වයකින් හා වෘත්තීය මට්ටමකින් පවත්වාගෙන යාමට ආයතනය ක්‍රියාකරයි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අද්විතීය ආයතනයක් ලෙස කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය 1998 වර්ෂයේ සිටම ක්‍රියාත්මක වනුයේ ස්වයං මූල්‍ය පදනමක් මතයි. ආයතනය මේ වන විට කළමනාකරණ පශ්චාත් උපාධිධරයන් හා ඩිප්ලෝමාලාභීන් 2500 කට අධික සංඛ්‍යාවක් බිහිකර ඇත.

2. **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකරණ වගකීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරයි.

3. **ප්‍රකාශනවල අනුකූලතාවය**

මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත්තේ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත. 1978 අංක 38 දරණ මූල්‍ය පනත හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලවය.

**සංසන්දනාත්මක තොරතුරු**

ආයතනය විසින්, ගිණුම්කරණ ප්‍රතිපත්ති. පූර්ව වර්ෂ හා සංගත ලෙස අනුගමනය කොට ඇත. සංසන්දනය කළ හැකි වනු පිනිස පූර්ව වර්ෂයේ සංඛ්‍යා ද දක්වා ඇත.

4. **දේපල, පිරියත හා උපකරණ**

(අ) **පිරිවැය**

දේපළ, පිරියත හා උපකරණ වාර්තා කරනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍ෂයවීම් අඩුකළ වටිනාකමටයි.

(ආ) **ක්‍ෂයවීම්**

ඇස්තමේන්තුගත ජීවිත කාලය තුළ සමාන වාරිකයන් පොත් වලින් කපාහැරෙන පරිදි දේපල, පිරියත හා උපකරණ පිරිවැය පදනම් කරගෙන සරල මාර්ග ක්‍රමයට

ක්ෂය කරනු ලැබේ. ඉඩම් සඳහා ක්ෂය ප්‍රතිපාදනයන් සිදු නොකෙරේ. භාවිතාකරන ලබන ක්ෂය අනුපාතිකයන් පහත දක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ලී බඩු සහ උපකරණ | 10% |
| පිරියත හා යන්ත්‍ර | 10% |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 20% |
| කාර්යාලීය උපකරණ | 20% |
| මෝටර් වාහන | 20% |
| උපාධි ලෝගු | 20% |
| පොත් සහ වාර ප්‍රකාශන | 20% |

දේපළ පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදනයන් සිදුකෙරෙනුයේ ඒවා භාවිතය සඳහා සුදුසු තත්ත්වට පත්වූ විටය.

5. **ආයෝජන**

කෙටිකාලීන ස්ථාවර තැන්පතුවලින් සමන්විත ආයෝජන පිරිවැයට දක්වා ඇත.

6. වර්ෂය තුළදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගනනය කරන ලද පහත සඳහන් වත්කම් සඳහා වූ ගැලපුම් 2014- අප්‍රේල් 01 දින සිදුකරන ලදි.

| **අයිතමය** | **ප්‍රත්‍යාගණන අතිරික්තය/ ඌනතාවය (රු.)** |
|---|---|
| 1. ලී බඩු | 4761623.39 |
| 2. කාර්යාල උපකරණ | 10424584.76 |
| 3. රසායනාගාර හා ඉගැන්වීමේ උපකරණ | (4568125.95) |
| 4. පිරියත හා යන්ත්‍ර | 43188.18 |
| | 10661270.38 |

ප්‍රත්‍යාගනිත අයිතමයන් සඳහා ක්ෂය ප්‍රතිපාදනයක් සිදු කරන ලද්දේ ඒවායේ ඇස්තමේන්තුගත අනාගත ජීවිත කාලය සැළකිල්ලට ගෙනයි.

7. **ජංගම බැරකම්**

ජංගම බැරකම් යටතේ දක්වා ඇත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ සිට වර්ෂයක් තුළ ගෙවිය යුතු බැරකම්ය.

8. **විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්**

(අ) **පාරිතෝෂික ගෙවීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි දක්වා ඇති පාරිතෝෂික ගෙවීම් සූත්‍ර ක්‍රමය පදනම් කොට ගෙන පාරිතෝෂක වගකීම් සඳහා ප්‍රතිපාදනයන් සිදුකර ඇත.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව වරෂ 5ක අඛණ්ඩ සේවා කාලයක් සහිත සේවාදායකයින් සම්බන්ධයෙන් පාරිතෝෂික ගෙවීම් වගකීම පැනනැගේ.

(ආ) **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල**

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීමට කැමැත්ත ප්‍රකාශ නොකරන ලද සේවා නියුක්තිකයින් සඳහා ජීවන වියදම් දීමනාවද ඇතුළත් දළ වැටුප පදනම් කොටගෙන ආයතනය විසින්, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට 15% ක දායක මුදල් ගෙවනු ලැබේ.

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීමට කැමැත්ත ප්‍රකාශ කරන ලද සේවා නියුක්තිකයන් සඳහා ජීවන වියදම් දීමනාවද ඇතුළත් දළ වැටුප පදනම් කොට ගෙන ආයතනය විසින්, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට පිළිවෙලින් 7% ක් 8% ක් දායක කරනු ලැබේ.

ජීවන වියදම් දීමනාවද ඇතුලත් දළ වැටුපෙන් 3% ක් ආයතනය විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ලෙස ගෙවනු ලැබේ.

9. **අයභාරය හඳුනාගැනීම**

ආයතනය තුළට ගලාඑන ආර්ථික ප්‍රතිලාභ වලත් ඒ හා සම්බන්ධව දරණ ලද හෝ දැරිය යුතු පිරිවැයෙහි ප්‍රමාණයත් මත අයභාරය හඳුනාගැනීම සිදු කෙරේ.

(අ) ඉගැන්වීම් ගාස්තු
ඉගැන්වීම වෙනුවෙන් සිසුන්ගෙන් ලැබෙන අයභාරය කාල අනුපාතික පදනම මත හඳුනාගැනේ.

(ආ) ආයෝජන සඳහා පොලී
ආයෝජන සඳහා පොලිය උපචිත වීමේ පදනම මත හඳුනාගැනේ

(ඇ) ව්‍යාපෘති ආදායම්
ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ පදනම මත එම අදායම් හඳුනාගැනේ

(ඈ) වෙනත් ආදායම්
වෙනත් ආදායම් ඒවා උපචිත වීමේ පදනම මත හඳුනාගැනේ

10. **වියදම් හඳුනාගැනීම**

නිශ්චිත ආදායම් අයිතමක ඉපයීම හා සෘජුවම සම්බන්ධ වන වියදම් පදනම් කරගෙන වියදම් හඳුනාගැනීම සිදුකෙරේ. ආයතනයේ කාර්යක්‍ෂමව පවත්වාගෙන යාමේදී දැරීමට සිදුවන වියදම් හා දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීමේ වියදම් ආදායමෙන් අඩුකිරීම් ලෙස සළකනු ලැබේ.

11. **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් හා සමාන ද සමන්විත වනුයේ අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු වලිනි.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 02 දැක්වෙන වක්‍ර ක්‍රමය භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කොට ඇත.

12. ආයතනය විසින් පවත්වන ලද විමර්ෂණය හේතුවෙන් තමාට හානියක් සිදුවූ බව සළකා කලින් සිටි නියෝජ්‍ය මූල්‍යාධිකාරී විසින් ආයතනයෙන් රුපියල් මිලියන 30 ක වන්දියක් ඉල්ලා කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇත.

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල්)

12. පිරිවැය - දේපල, පිරියත සහ උපකරණ

| පිරිවැය / ප්‍රත්‍යගනිත අගය | 2014 ජනවාරි 01 දිනට ශේෂය | එකතුකිරීම් | ඉවත්කිරීම් | ගැළපුම් | ප්‍රත්‍යාගණිත අතිරික්තය/ ඌනතාවය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ඉඩම | 5,000,000.00 | - | - | - | - | 5,000,000.00 |
| ඉඩම් හා ගොඩනැගිලි පුනරුත්ථාපනය හා නවීකරණය | 25,864,929.74 | 2,660,542.28 | - | - | - | 28,525,472.02 |
| ලී බඩු | 23,912,934.40 | 2,076,890.00 | (890,750.00) | (16,101,756.79) | 4,761,623.39 | 13,758,941.00 |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 27,168,602.31 | 1,390,071.08 | (21,750.00) | (20,110,766.34) | (4,568,125.95) | 3,858,031.10 |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | 21,757,519.00 | 727,499.95 | - | - | - | 22,485,018.95 |
| මෝටර් රථ | 12,814,997.00 | - | - | - | - | 12,814,997.00 |
| උපාධි ලෝගු | 2,074,527.00 | - | - | - | - | 2,074,527.00 |
| කාර්යාල සවිකිරීම් හා උපකරණ | 3,050,032.04 | - | - | - | - | 3,050,032.04 |
| කාර්යාල උපකරණ | 20,305,242.23 | 4,070,706.46 | (368,750.00) | (16,432,939.31) | 10,424,584.76 | 17,998,844.14 |
| පිරියත හා යන්ත්‍ර | 5,872,567.80 | - | - | (1,115,755.98) | 43,188.18 | 4,800,000.00 |
| ගොඩනැගිල්ල | 60,616,211.37 | - | - | - | - | 60,616,211.37 |
| | **208,437,562.89** | **10,925,709.77** | **(1,281,250.00)** | **(53,761,218.42)** | **10,661,270.38** | **174,982,074.62** |

| ක්ෂයවීම් | 2014 ජනවාරි 01 දිනට ශේෂය | වර්ෂයේ ක්ෂයවීම් | ඉවත්කල වත්කම් සඳහා ක්ෂයවීම් | ගැළපුම් | ප්‍රත්‍යාගණිත අගයන් | 2014-01-31 දින ශේෂය |
|---|---|---|---|---|---|---|
| ඉඩම | - | - | - | - | - | - |
| ඉඩම් හා ගොඩනැගිලි පුනරුත්ථාපනය හා නවීකරණය | 6,518,421.21 | 1,293,246.48 | - | - | - | 7,811,667.69 |
| ලී බඩු | 16,054,313.13 | 2,975,809.52 | (396,158.00) | (16,155,584.79) | - | 2,478,379.86 |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 19,865,134.51 | 1,122,978.85 | (16,312.00) | (20,110,766.34) | - | 861,035.02 |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | 17,278,917.39 | 1,389,960.95 | - | - | - | 18,668,878.34 |
| මෝටර් රථ | 10,306,987.27 | 1,173,560.00 | - | - | - | 11,480,547.27 |
| උපාධි ලෝගු | 1,648,665.00 | 249,760.00 | - | - | - | 1,898,425.00 |
| කාර්යාල සවිකිරීම් හා උපකරණ | 2,938,989.72 | 76,731.12 | - | - | - | 3,015,720.84 |
| කාර්යාල උපකරණ | 15,910,496.14 | 4,410,876.17 | (68,625.00) | (16,432,939.31) | - | 3,819,808.00 |
| පිරියත හා යන්ත්‍ර | 972,866.98 | 592,889.00 | - | (1,115,755.98) | - | 450,000.00 |
| ගොඩනැගිල්ල | 51,226,894.80 | 3,030,810.56 | - | - | - | 54,257,705.36 |
| | **142,721,686.15** | **16,316,622.65** | **(481,095.00)** | **(53,815,046.42)** | **0.00** | **104,742,167.38** |

ශුද්ධ අගය **70,239,907.24**

## 13. තොග

| | 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
|---|---|---|
| ප්‍රකාශන තොග | 1,469,919.81 | 4,184,566.28 |
| පාඨමාලා සඳහා නිර්දේශිත පොත් | 1,870,437.00 | |
| අලෙවිසැලෙහි තොග | 62,312.40 | 62,312.40 |
| ප්‍රකාශන තොග (ජාත්‍යන්තර ශාඛාව) | 832,912.00 | 832,912.00 |
| ඉවත්කරන ලද ද්‍රව්‍ය | 171,905.00 | |
| | **4,407,486.21** | **5,079,790.68** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්**
**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | (ශ්‍රී ලංකා රුපියල්) 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
|---|---|---|
| **14 කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්** | | |
| ආපදා ණය | 2,164,558.77 | 1,974,489.28 |
| සේවක ණය | 25,499.91 | 25,513.33 |
| පරිගණක ණය | 89,928.74 | 81,065.93 |
| වාහන ණය | 378,465.63 | 310,525.85 |
| උත්සව අත්තිකාරම් | 7,000.00 | 7,500.00 |
| | 2,665,453.05 | 2,399,094.39 |
| **15 තැන්පතු** | | |
| ජාත්‍යන්තර ශාඛාව | 438,000.00 | 438,000.00 |
| ව්‍යාපාර කළමනාකරණය පිලිබඳ විද්‍යාපති පාඨමාලාව ලැබිය යුතු | 413,100.00 | - |
| රාජ්‍ය පරිපාලනය පිලිබඳ විද්‍යාපති පාඨමාලාව ලැබිය යුතු | 222,000.00 | 440,000.00 |
| ලැබිය යුතු පොළී | 5,051,425.31 | 8,538,384.34 |
| ප්‍රකාශන අලෙවියෙන් ලැබිය යුතු | - | 417,000.00 |
| දර්ශනශූරී පාඨමාලා ගාස්තු වලින් ලැබිය යුතු | 150,000.00 | 1,882,500.00 |
| | 6,274,525.31 | 11,715,884.34 |
| **16 ස්ථාවර තැම්පතු** | | |
| F/D No 220141 ( BOC ) | 35,000.00 | 35,000.00 |
| F/D No 220209 (BOC) | 50,000.00 | 50,000.00 |
| F/D No 220018 (BOC) | 43,690.00 | 43,690.00 |
| F/D No 220267 (BOC) | 40,000.00 | 40,000.00 |
| F/D No 8551587 (BOC) | - | 1,181,136.86 |
| F/D No 8551588 (BOC) | - | 1,181,780.82 |
| F/D No 9543899 (BOC) | 3,353,233.22 | 3,034,600.20 |
| F/D No 9680349 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9680373 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9680289 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9680400 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9680415 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9717250 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9735361 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9735355 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9798584 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9798615 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9798638 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9802042 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 9802088 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 70393465 (BOC) | 2,969,126.89 | 2,639,223.90 |
| F/D No 70393475 (BOC) | 2,969,126.89 | 2,639,223.90 |
| F/D No 70393484 (BOC) | 2,969,126.89 | 2,639,223.90 |
| F/D No 70393496 (BOC) | 2,969,126.89 | 2,639,223.90 |
| F/D No 70393501 (BOC) | 2,969,126.89 | 2,639,223.90 |
| F/D No 70431658 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 70431699 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 70431966 (BOC) | 2,000,000.00 | 2,000,000.00 |
| F/D No 70486798 (BOC) | 2,942,266.01 | 2,638,803.60 |
| F/D No 70486804 (BOC) | 2,942,266.01 | 2,638,803.60 |
| F/D No 70505660 (BOC) | 2,942,734.65 | 2,639,223.90 |
| F/D No 70505677 (BOC) | 2,942,734.65 | 2,639,223.90 |
| F/D No 73188118 (BOC) | 19,287,784.62 | 17,864,649.12 |
| F/D No 74147601 (BOC) | 30,136,141.14 | 28,149,356.36 |
| F/D No 74811175 (BOC) | 20,000,000.00 | 20,000,000.00 |
| F/D No.75405922 (BOC) | 20,000,000.00 | 20,000,000.00 |

| | | |
|---|---|---|
| F/D No.76263451 (BOC) | 7,500,000.00 | - |
| F/D No.76869279 (BOC) | 15,000,000.00 | - |
| F/D No.76869279 (BOC) | 10,000,000.00 | - |
| F/D No 376062 ( NSB ) | 14,568,159.35 | 11,772,250.00 |
| F/D No 424736 ( NSB ) | 26,487,562.50 | 23,544,500.00 |
| F/D No 413214 (Peoples Bank) | 20,809,938.32 | 18,976,781.25 |
| | **246,290,062.60** | **201625919.11** |

**කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්**
**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | (ශ්‍රී ලංකා රුපියල්) | |
|---|---|---|
| | 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
| **17 මුදල් හා මුදල් හා සමාන දෑ** | | |
| ලංකා බැංකුව බොරැල්ල - ගිණුම් අංක 192596 | 13,600,447.07 | 27,493,987.56 |
| ජාත්‍යන්තර ශාඛාව - ගිණුම් අංක 021580683001 | 87,461.00 | 87,461.00 |
| ලංකා බැංකුව බොරැල්ල - විදේශ මුදල් ගිණුම් අංක -9719360 | 253,208.59 | 254,906.00 |
| | 13,941,116.66 | 27,836,354.56 |
| **18 අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල්** | | |
| ඩී. එස්. ජයසුන්දර ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 231,572.20 | 218,471.80 |
| කමලාගොඩ ස්වර්ණ මුද්‍රිකා අරමුදල | 28,567.74 | 28,567.74 |
| අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල | 118,516.00 | 118,516.00 |
| | 378,655.94 | 365,555.54 |
| **19 කලින් ලද ආදායම්** | | |
| රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 1,658,585.00 | 3,257,520.00 |
| දර්ශනශූරී පාඨමාලාව | 3,500,000.00 | 1,650,000.00 |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව | 65,240,370.00 | 87,104,700.00 |
| | 70,398,955.00 | 92,012,220.00 |
| **20 තැන්පතු ලැබීම්** | | |
| ටෙන්ඩර් තැන්පතු | 45,000.00 | 15,000.00 |
| ආරක්ෂණ තැන්පතු | 35,000.00 | 35,000.00 |
| විවිධ තැන්පතු- ආදිශිෂ්‍ය සංගමය | 55,000.00 | 905,000.00 |
| විවිධ තැන්පතු | 964,260.51 | 964,260.51 |
| | 1,099,260.51 | 1,919,260.51 |
| **21 වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දේ** | | |
| ජාත්‍යන්තර අංශය | 7,860,000.00 | 7,860,000.00 |
| උපචිත වියදම් | 13,428,477.84 | 9,415,120.53 |
| කලින් ලද පුස්තකාල දායක මුදල | 1,621,808.45 | 1,621,808.45 |
| විභාග ගෙවීම් සඳහා වෙන්කිරීම- රාජ්‍ය කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව | - | 500,000.00 |
| විදේශ ශිෂ්‍යයින් සඳහා වූ ශිෂ්‍යත්ත්ව | 228,999.99 | - |
| විස්කම් බිල්ඩර්ස් | 2,524,569.08 | - |
| උපදේශක ගාස්තු | 135,973.20 | - |
| | 25,799,828.56 | 19,396,928.98 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ඊසී/ඊ/පීඅයිඑම්/6/14/2 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2015 අගෝස්තු 21 දින

අධ්‍යක්ෂ,

කළමනාකරණය පිළිබඳ පශ්චාත්උපාධි ආයතනය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1985 අංක 03 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ අංක 19 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය, 108 වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2015 ජුනි 09 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ III වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් පන්තියේ සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් පන්ති 04 කට අදාල වටිනාකම 9,427,448 ක වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලද වත්කම් වල ඵලදායි ජීවකාලය තීරණය කිරීම වෙනම කමිටුවක් විසින් සිදු කර තිබූ නමුත්, මෙම කමිටුව තුළ අදාළ විෂය පිළිබඳ විශේෂඥතාවයකින් යුක්ත පුද්ගලයෙකු ඇතුළත් වී නොතිබූ බැවින්, ඵලදායි ජීවකාල ඇස්තමේන්තු වල යෝග්‍යතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

(අ) විගණනයේදී සිදුකරන ලද ගණනය කිරීම්වලට අනුව ප්‍රත්‍යාගණනයන්ට ලක්කල වත්කම්වල පිරිවැය, සමුච්චිත ක්ෂය වීම් නිවැරදිව හඳුනාගෙන ගැලපීම් සිදු නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබූ ජංගම නොවන වත්කම්වල පිරිවැය, සමුච්චිත ක්ෂය, වර්ෂයේ ක්ෂය හා ප්‍රත්‍යාගණන අතිරික්තය පිළිවෙළින් රු.2,904,701, රු.2,641,326, රු.5,240 හා රු.383,618ක් අඩුවෙන් දක්වා තිබුණි. මේ හේතුවෙන් වසරේ ආදායම රු.5,240කින් වැඩියෙන් දක්වා තිබුණු අතර, ජංගම නොවන වත්කම් රු.263,375කින් අඩුවෙන් දක්වා තිබුණි.

/

(ආ) ස්ථාවර තැන්පතු සහතික හා අලුත් කිරීමේ නිවේදනයන්හි සඳහන් පොලී අනුපාතික අනුව සමාලෝචිත වර්ෂයට අදාළ ආයෝජන මත පොලී ආදායම රු.16,308,282ක් හා ලැබිය යුතු පොලිය රු. 5,322,362ක් වුවද මූල්‍ය ප්‍රකාශන තුල පොලී ආදායම රු. 16,037,345ක් හා ලැබිය යුතු පොලිය රු.5,051,425ක් ලෙස දැක්වීම හේතුවෙන් වසරේ ආදායම හා ලැබිය යුතු පොලී ආදායම රු. 270,937 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ආයතනය විසින් වැඩිපුර ගණනය කොට ගිණුම්ගත කර තිබූ රු.362,918ක පොලී ආදායම නිවැරදි කිරීමේදී පොලී ආදායම් ගිණුම හර කිරීම වෙනුවට ආයෝජන ගිණුම හර කර තිබුණි.

## 2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනය විසින් භෞතික හා මානව සම්පත් භාවිතයෙන් ආයතනයේ නිල මුද්‍රාව සහිතව සහතික පත්‍ර ප්‍රදානය කරමින් 2014 වර්ෂය තුළ පුහුණු පාඨමාලා 12 ක් පවත්වා තිබූ අතර, ඉන් 8 ක් වර්ෂය තුලදී නිම කර තිබුණි. එම පාඨමාලා 8 හි ශුද්ධ අතිරික්තය වූ රු.8,789,675න් රු.7,491,476ක මුදලක් උපදේශන සේවා වලින් ලැබෙන මුදල් වියදම් කිරීම සඳහා නිකුත් කර ඇති 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය වැරදි සහගත ලෙස අර්ථකථනය කර ගනිමින් කාර්ය මණ්ඩලය අතර, බෙදා දී තිබුණි.

(ආ) ආයතනය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එකතුව රු.350,000 ක මුදලක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත ප්‍රදාන වශයෙන් ලබාදී තිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනය විසින් 2007 වර්ෂයේදී ජාත්‍යන්තර ශාඛාවක් ආරම්භ කර තිබූ අතර, වංචාවක් හේතුවෙන් 2009 සැප්තැම්බර් මාසයේදී එකී ශාඛාව වසා දමා තිබූ නමුත්, එම ශාඛාවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ වශයෙන් පිළිවෙලින් රු.2,911,912 හා රු.11,603,217ක් දීර්ඝ කාලයක් තිස්සේ විමර්ශණය කිරීමකින් තොරව අඛන්ඩව ඉදිරියට ගෙනගොස් පැවතුණි.

(ආ) සේවයෙන් ඉවත්ව ඇති ගිවිසුම් කඩකල කථිකාචාර්යවරයෙකුගෙන් අයවිය යුතු රු.4,312,500ක බැදුම්කර වටිනාකම රු.89,843ක් බැගින් වාරික 48 කින් අයකර ගැනීමට පාලක සභාව තීරණය කර තිබූ අතර ඒ අනුව 2014 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් ලැබිය යුතු රු.3,886,484ක් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

## 2.5 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1985 අංක 03 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ (8)(ජ) වගන්තිය | ආයතනයේ මුදල් ආයෝජනය කිරීමේදී කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව ආයතනය රු.මිලියන 50ක අයෝජනයන් සිදුකර තිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 5.1 වගන්තිය | පිළිවෙලින් රු.42,835 හා රු.46,720 බැගින් මාසිකව මූලික වැටුපක් ලබන අතිකාල අහිමි මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු වෙත සාමාන්‍ය වැටුප් හා දීමනාවලට පරිබාහිරව 2014 වර්ෂය සඳහා සම්බන්ධීකරණ දීමනා ලෙස රු.932,250ක් ගෙවා තිබූ අතර, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා |

ගෙන නොතිබුණි. 2013 ගිණුම් වර්ෂයේදී ඉහත ගෙවීම් නතර කරන බවට ආයතන අධ්‍යක්ෂවරයා විගණකාධිපති වෙත ලිඛිතව දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 අප්‍රේල් 10 දිනැති 4/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය

ආයතනය විසින් වත්කම් අපහරණයන් දෙකක් සිදුකර තිබූ අතර අපහරණයට යෝජිත භාණ්ඩ ලැයිස්තු විගණකාධිපතිවරයා වෙත ලබාදී නොතිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුව රු.628,250 කට අගය කර තිබූ කාර්යාල උපකරණ හා ලීබඩු උපකරණ 89 ක් සහ වෙනත් අයිතම 20 ක් අගය කර දින කිහිපයක් තුළ රු.66,805 කට සහ 2015 පෙබරවාරි 21 දින තක්සේරු අගය රු.669,000 වූ වත්කම් අයිතම 153 ක් රු.36,410 කට කළමනාකරණ මණ්ඩල අනුමැතියකින් තොරව ආයතනයේ සේවකයන් වෙත විකුණා තිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුව ඉහළ අගයක් ලබාදී තිබූ මෙම වත්කම් මෙලෙස ඉතා පහළ අගයකට විකිණීමට හේතු වූ කරුණු විගණනයට පැහැදිළි නොවුණි. එක් නිලධාරිණියක් විසින් ඉවත් කරන ලද වත්කම් අයිතම 153 න් 112ක් රු.7,110ක් ගෙවා මිළදී ගෙන තිබුණි. ඇය මිලදීගත් වත්කම්වල තක්සේරු අගය 420,750ක් විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.48,834,179ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.40,784,288ක් වුයෙන් සමලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය රු.8,049,891 ක් විය. වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය රු.10,661,270 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ඩුබායි ශාඛාවේ රු.මිලියන 58.2ක වංචාව සම්බන්ධයෙන් 2009 වර්ෂයේදී පැවති පොදු ව්‍යාපාර කමිටු වාර්තාව මගින් සිදු කරන ලද නිර්දේශ පදනම්ව විමර්ෂණය සඳහා 2011 මාර්තු 29 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි. එහෙත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ආයතනය වෙත මෙතෙක් කිසිදු වාර්තාවක් ලැබී නොතිබුණු අතර, ආයතනය විසින් පරීක්ෂණය කඩිනම් කර ගැනීම සඳහා කිසිදු සක්‍රිය දායකත්වයක් ලබාදී නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

(අ) ගිවිසුමකට එළඹීමකින් හා බැඳුම්කරයක් ලබා ගැනීමකින් තොරව ආයතනය විසින් බාහිර පුද්ගලයෙකු වෙත 2014 දෙසැම්බර් 15 දින රු.820,000ක අත්තිකාරමක් උපාධි ප්‍රදානෝත්සවයේ භෝජන සංග්‍රහයේ වියදම් සඳහා ලබාදී තිබුණි. විගණිත දිනය වූ 2015 මැයි 30 දින වනවිටත් ඉහත අත්තිකාරම පියවා නොතිබුණි.

(ආ) ප්‍රත්‍යාගණනයට ලක්කරන ලද වත්කම් පංති 4හි එක් එක් වත්කම් පංතියෙහි තක්සේරු කිරීමට යෝජිත දිනට වූ පිරිවැයට සමාන අයිතමයන් ඇතුලත් උපලේඛනයක් තක්සේරුකරුවන් වෙත ලබාදී නොතිබුණු අතර, භෞතිකව ඉදිරිපත් කරන ලද අයිතමයන් පමණක් ප්‍රත්‍යාගණනයට ලක්කර තිබුණි. මේ හේතුවෙන් වත්කම් පංතියට අදාළ සියලු අයිතමයන් ප්‍රත්‍යාගණනයට ලක්කලේද යන්නත් ප්‍රත්‍යාගණන දිනට වත්කම්

පංතියට ගිණුම්ගත වී ඇති සියලු වත්කම් නිවැරදිව පැවතියේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. මේ අනුව ඉහත ප්‍රත්‍යාගණනය නිවැරදිව සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

## 4.2 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 50 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් 33 දෙනෙකු ගිණුම් වර්ෂය අවසාන දින වනවිටත් පුරප්පාඩුව පැවතුණි. පුරප්පාඩු පිරවීම සඳහා ආයතනය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර, ස්ථිර තනතුරු වල රාජකාරී ආවරණය සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) මානව සම්පත් සැලැස්මෙහි අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු ඇතිකර තිබූ අතර, ඒ සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම තනතුරුවල රාජකාරී ආවරණය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 8 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

ඉහත පරිදි කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගැනීමට සහ ඔවුන්ගේ වැටුප් හා දීමනා තීරණය කිරීමට 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 චක්‍රලේඛයේ 9.7 හා 9.10 ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### විගණන කළමනාකරණ කමිටු

2003 ජුනි 2 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් පැවැත්විය යුතු වුවත්, 2015 ජුනි 15 දින වනවිටත් 2015 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) තොග පාලනය

(ඇ) පිරිස් කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති(වැඩබලන)

## 2014 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳව PIM ආයතනයේ අදහස් දැක්වීම

2.2.1. <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි ගිණුම් සම්මත</u>

ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම 2012 වර්ෂයේ දී අරඹන ලදු ව, 2013 වර්ෂය දක්වා ම සිදු කරන ලද හෙයින්, 2012 වර්ෂයෙහි පසු භාගයෙහි ද 2013 වර්ෂයෙහි ද මිල දී ගත් වත්කම්, ප්‍රත්‍යාගණනය නොකරන ලදි. ප්‍රත්‍යාගණනය පිළිබඳ වාර්තාව සැකැසූ දිනයෙහි දී, ඉදිරියට ගෙන යන ලද හා නියමිත වටිනාකම්වල ද්‍රව්‍යමය විචල්‍යතාවක් නොවූයෙන්, මෙ ම වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් හා ගිණුම්ගත කොට සම්බන්ධ කරන ලදි.

2.2.2. <u>ගිණුම් පිළිවෙත්</u>

ආයතනය සතු ව පැවති වත්කම් අතුරින් දව භාණ්ඩ, කාර්යාලයීය උපකරණ, අධ්‍යාපනික උපකරණ හා යන්ත්‍රෝපකරණ පමණක් ප්‍රත්‍යාගණනය කරන ලදි. සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවට වත්කම්වල ඵලදායිතා සීමාව තීරණය කිරීමට පත්කරන ලද උපදේශකවරයා අවුරුදු 25 කට වැඩි කාලයක් ඉගැන්වීමෙහි නිරත වූ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකි. කමිටුවේ සෙසු සාමාජිකයන් දෙදෙනා විශ්වවිද්‍යාල සේවාවෙහි අවුරුදු 29 ක සේවාවක් සහිත ජ්‍යෙෂ්ඨ නිලධරයෝ වූහ. ඒ අනුව කමිටුවට ඇතුළත් වූයේ උක්ත කාර්යය සඳහා උපරිම සුදුසුකම් ඇති සාමාජිකයෝ වූ හ.

2.2.3. <u>ගිණුම් ප්‍රකාශනවල අඩුලුහුඩු</u>

(අ) 2015 ජූලි මස 07 වැනි දින නියෝජ්‍ය විගණකාධිපතිවරයා හා සමඟ පැවති රැස්වීමේ දී එකඟ වූ පරිදි, ප්‍රත්‍යාගණනය නොකරන ලද වත්කම්, මිල දී ගත් වත්කම් පදනම් කරගෙන, 2015 වර්ෂයේ දී ගිණුම්ගත් කෙරනු ඇත. මෙහි-ලා යම් සංශෝධන කළ යුතු වන්නේ නම්, එ ම වත්කම් ගිණුම් ප්‍රකාශනයෙහි සිදු කෙරෙනු ඇත.

(ආ) ගිණුම් වර්ෂයේ අවසන් දිනට කල් නොපිරිණු තැන්පතු සඳහා එකතු වුණු පොළී ආදායම, බැංකු වාර්තා පදනම් කරගෙන ගිණුම්ගත කොට ඇත. ආයතනයෙහි අදහස වනුයේ අතින් කරන ලද වාර්තාවට සාපේක්ෂව පරිගණක ගත කරන ලද දත්ත පදනම් කරගෙන බැංකුවෙන් පිළියෙළ කරන ලද පොළී ආදායම් වාර්තා පිළිගත හැකි බව යි.

(ඇ) 2015 ගිණුම් වාර්තා සකසන විට මෙ ම විෂමතාව නිවැරැදි කරනු ඇත.

2.3. <u>ප්‍රමාණවත් අධිකාරී බලයන් නොමැති ගිණුම් කටයුතු</u>

(අ) කළමනාකරණ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය විසින් පවත්වනු ලබන කළමනාකරන ප්‍රවර්ධන වැඩසටහන් සඳහා රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 380 යොදා ගනු බැබේ. මෙ ම වැඩ සටහන්වල පරමාර්ථය වන්නේ, ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් අනුව විවිධ ආයතනවල කාර්යමණ්ඩල සඳහා පුහුණු හා

ප්‍රවර්ධන කටයුතු සැලැසුම් කොට පැවැත්වීම යි. තව ද මෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ පෞද්ගලික අංශයෙහි කාර්ය මණ්ඩලවල ප්‍රවර්ධන අවශ්‍යතා සඳහා කළමනාකරන පශ්චාත් උපාධි ආයතනය සතු කළමනාකරණ විශේෂඥතා යොදා ගැනීම යි. මෙ ම වැඩ සටහන් උපදේශන සේවා ගණයට ඇතුළත් වන අතර, පශ්චාත් උපාධි - ඩිප්ලෝමා සහතික පත් පාඨමාලාවට අයත් නොවන ඒ ඒ ආයතනවල පවතින විවිධ අවශ්‍යතාවලට අනුකූල වන ලෙසින් පිළියෙළ කිරීම යි.

විශ්ව විද්‍යාලයවලින් ඉපැයෙන ආදායම් හා සිදු කෙරෙන වියදම් මෙන් ම පර්යේෂණ හා උපදේශන සේවා, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් ද පිළිගන්නා ලද රාජ්‍යමූල්‍ය චක්‍රලේඛ අංක 380 ට සම්බන්ධ වේ. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් මෙහෙයවනු ලබන කළමනාකරණ ප්‍රවර්ධන වැඩ සටහන් අයත් වන්නේ මෙ ම චක්‍ර ලේඛයෙහි ඇතුළත් පුහුණු හා උපදේශන සේවා ප්‍රවර්ගවලට යි. 2007 වර්ශයෙහි දී ජාතික ප්‍රසම්පාදන ඒජන්සිය විසින් නිකුත් කරන ලද උපදේශන සේවා සංග්‍රහයට අනුව, කාර්ය මණ්ඩල ශක්‍යතා ප්‍රවර්ධනය හා දැනුම ව්‍යාප්ත කිරීම, උපදේශන සේවාවලට අයත් වේ.

(ආ) ආයතනය මෙහෙයවනු ලබන්නේ, ඉන් ඉපැයෙන අරමුදලෙනි. ආයතනික හා සමාජ වගකීම් පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව, මෙ ම පරිත්‍යාග සිදු කරන ලද්දේ කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව යි.

2.4. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ජාත්‍යන්තර ශාඛාවට අදාළ ව ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ කවරේ දැයි නිර්ණය කිරීම් සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා ලගැනීමට නොහැකි ව පවතී. ජාත්‍යන්තර ශාඛාවේ ගිණුම් පිළිබඳ ව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තු ව මඟින් විමර්ශනයක් කෙරෙමින් පවතී.

(ආ) චන්දන චන්ද්‍රසිරි මහතාගෙන් අය විය යුතු මුදල පිළිබඳ ව ඇපකරුවන් දැනුම්වත් කොට ඇති අතර, නෛතික පියවර ගැනීමට ද පියවර ගෙන ඇත. එහෙත්, දැනටමත් චන්දන චන්ද්‍රසිරි මහතා මසකට රු 15.000/ බැගින් ගෙවමින් සිටින හෙයින්, එසේ එම මුදල තව දුරටත් ගෙවීමට ඔහුට ඉඩ දීමට ද මණ්ඩලය තීරණය කෙට ඇත. තව දුරටත් ඔහු ගෙන් අයවිය යුතු ශේෂයක් පවතී නම් එම මුදල ඔහුගේ ශේෂ ව ඇති සේවක අර්ථසාදක අරමුදලෙන් ද සසු ආන්තික ගෙවීම්වලින් ද අය කරගැනීමට ද කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කොට ඇත.

2.5. නීතිවලට, නියමයනට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) ආයතනයේ ගිණුම්වල යම් අතිරික්තයක් පවතී නම් එම අතිරික්ත ප්‍රමාණයන් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණවල ප්‍රමාදය මඟ හරිමින්, අධ්‍යක්ෂ වරයාගේ අනුමැතිය ඇතිව, රාජ්‍ය බැංකුවල ආයෝජනය කිරිමට කටයුතු කරනු

ඇත. ඉන් අනතුරු ව, කළමනාකරණ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා ගනු ඇත.

(ආ) විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ 5.1 ඡේදය අතිකාල දීමනා පිළිබඳ ව සඳහන් වේ. උක්ත නිලධරයනට ගෙවීම් සිදු කොට ඇත්තේ අතිකාල පදනම් කොට ගෙන නොවන අතර, එ ම ගෙවීම සිදු කොට ඇත්තේ ආයතන සංග්‍රහයෙහි 8(iii) ඡේදය අනුව හා කළමනාකරණ අධ්‍යක්‍ෂ මණ්ඩලයට පැවරුණු බලය ප්‍රකාර ව, බාහිර ව සිදු කරන ලද පත්වීම් පදනම් කර ගෙන ය. මෙ ම නිලධරයන්ගේ සේවා අතිශයින් අවශ්‍ය වන්නේ ආයතනයේ අධ්‍යාපනික කටයුතු සතියේ දිනවල 1700 පැය සිට 2100 පැය දක්වා මෙන් ම සති අන්තයේ හා රාජ්‍ය නිවාඩු දිනවල පැවැත්වෙන නිසා ය.

ආයතනයේ කටයුතු මෙහෙයැවෙන්නේ සවයං-මූල්‍ය උත්පාදන පදනමක් මත හෙයින්, කාර්යාලයෙන් බැහැර ව මෙන්ම සති අන්තයෙ දී සේවාවේ යෙදෙන කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීමට තීරණය කිරීම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින්, 2015 සැප්තැම්බර් 04 දිනැති ලිපියෙන් කළමනාකරන අධ්‍යක්‍ෂ මණ්ඩලයට බලය පවරා ඇත.

(ඇ) 2014 ජනවාරි 30 වැනි දින සේවකයනට විකුණන ලද්දේ පාවිච්චියට නුසුදුසු සේ හඳුන්වන ලද වත්කම් ය. ඉදිරියට ගෙන යෑමේ දී ශූන්‍ය අගයක් ගත් වත්කම් ඉක්මනින් ඉවත් කිරීමට අවශ්‍ය වූ හෙයින්, ආයතනයේ ප්‍රධාන විධායක නිලධර මහතාගේ අනුමැතිය මත, මෙ ම භාණ්ඩ විකුණන ලද්දේ මිල ගණන් කැඳවන ලදුව, තරගකාරී පදනමක් මත ය. මෙ ම අනුමැතිය දෙන ලද්දේ අංක 2013/09 දරණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍ර ලේඛයෙහි අංක 4.10 ඡේදයෙහි දක්වෙන විධිවිධාන අනුව ය. මෙ ම ආයතනයේ පදනම වූයේ වෙන්දේසියෙහි දී ලද උපරිම මිල ගණන් ය.

3.2. <u>ආයතනය මඟින් හෝ ආයතනයට විරුද්ධ ව හෝ ගන්නා ලද නෛතික ක්‍රියා මාර්ග</u>

සඳහන් කරන ලද පරීක්‍ෂණය පවත්වනු ලබන්නේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මඟින් වන අතර, විටින් විට ආයතනයෙන් තොරතුරු ලබා ගනිමින් පවතී.

4.1. <u>කළමනාකරණ අකාර්යක්‍ෂමතා</u>

(අ) වර්ෂ 2014 පැවැති උපාධි ප්‍රධානෝත්සවයෙහි සමහර කටයුතු ද සංවිධානය කරන ලද්දේ ආයතනයේ ශිෂ්‍යයන් විසින් වන අතර, මෙ හි සඳහන් කරන ලද අත්තිකාරම ලබා දෙන ලද්දේ එම කටයුතු සඳහා ය. ස්වෙච්චාවෙන් ඉදිරිපත් වන ශිෂ්‍යයන්ගෙන් කාර්යවල බැඳුම්කර ලබා ගැනීම ප්‍රායෝගිකව අපහසු වෙයි අනුග්‍රාහකයන් ගෙන් ලබා ගන්නා ලද පරිත්‍යාගවලින් මෙ ම අත්තිකාරමෙන් 95% ක් දැනටමත් ගෙවා ඇත.

(ආ) පසුගිය වසර 29 තුළ දී මිල දී ගත් වත්කම්වලින් බොහොමයක් ප්‍රතිගණනය කිරීමේ දී දක්වා ඇත්තේ ශූන්‍ය වටිනාකම් ලෙසිනි. මෙ ම වත්කම්වල වටිනාකම්-ලේඛනයක් සැකැසීම අපහසු වූ කාර්යයක් වූ හෙයින් ප්‍රත්‍යාගණන

කටයුතු මෙහෙයවන ලද්දේ එම වත්කම් භෞතික ව පවතිනවා යනු සැලැකිල්ලට ගනිමිනි. ආයතනය සතු වත්කම්, භෞතික ව නොපවතින බවට කිසිදු තොරතුරක් ආයතනය සතුව පවතී.

4.2. <u>කාර්යමණ්ඩලය කළමනාකරණය කිරීම</u>

(අ) ආයතනයෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු බොහොමයක් අයත් වනුයේ අධ්‍යයන කාර්යමණ්ඩල ප්‍රවර්ගයට යි. මෙ ම පුරප්පාඩු පිරවීම සඳහා අදාළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වුව ද, සුදුසුකම් සහිත ඉල්ලුම්කරුවන් නොවුණු හෙයින් මෙ ම තනතුරු පිරවීමට නොහැකි විය. දැනට අදාළ නොවන සේ සැලකෙන තනතුරු අහෝසි කිරීමට ද ක්‍රියා කොට ඇත.

(ආ) ආයතනය විසින් අළුත් පශ්චාත් උපාධි පාඨමාලා රැසක් අරඹා ඇති හෙයින් අවශ්‍යතා පදනම් කර ගෙන කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම් සිදු කොට ඇත. ආයතනික නියමාවලිය අනුව මෙ ම බඳවා ගැනීම් කිරීමට කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පවරා ඇත.

5. <u>වගබලාගැනීම හා යහපාලනය</u>

සාකච්ඡා කළ යුතු යැයි සැලැකෙන කරුණු සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්කරවීමට කටයුතු කෙරෙනු ඇත.

අධ්‍යක්ෂ
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
2015, දෙසැම්බර් මස 31 දින